# නියමුවා

“අපි මුල පිරීම පටන් ගතිමු. කිනම් රටක නිර්ධන පංතිය විසින්, කිනම් දවසක හා කිනම් වෙලාවක මේ ක්‍රියාදාමය සම්පූර්ණ කරනු ලබයිද යන්න වැදගත් නොවේ. වැදගත් දෙය නම්, අවහිරය මඟහරවා, මාර්ගය විවෘත කර, මාවත පෙන්වා දී තිබීමය.”

*ලෙනින්*
*තෝරාගත් කෘති,*
*12වැනි වෙළුම,*
*41 පිටුව*

ISSN 1391 - 1031 | 2022 නොවැම්බර් | 27 වෙළුම | 06 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=



## මතක මහ කන්ද

නිහඬ මිටියාවත් අතර
දිගු කලකි ඉඩෝරය
කේඩෑරි මහපොළොව
සුසුම් මියැදෙන අතර

සිහින සිහිනයන් ලෙස
දියව යන කුහර තුළ
කාල අවකාශයේ
මතුව එයි නුඹේ රුව...

ඈත දුම්බර පැලක
නගර වීදිය කොණක
බඩගින්න ඇවිද යයි
කඳුළු සුසුමන් පාකර

අපට අප අහිමි කළ මේ යුගය
මතු පිටින් ගලා යනවිට දිවිය
දිනුම ඇත්තේ සටන තුළ බව
කියා දුන් මිනිසා නුඹය...

දැවෙන පීඩිත භාවයක
දනන් නින්දෙන් මුදාගෙන
සැබෑ වෙන  නව අරුණෝදයක
ජීවිතය යළි දිය යුතුය

ඒ මහා ගමනක කතාවේ
සැබෑ අරගල භූමියේ
පංතියට මාවත කියාදුන්
විසල් මිනිසා නුඹම වේ...

නුඹ සමඟ නුඹ සමව ගමනක
සියදහස් ගණනින් ගියේ
ඉල්මහේ හිරු දහස නුඹලා
මඟ කියන අඳුරුම පැයේ

මතක මහ කන්දම ඇවිස්සෙයි
අඳුරුබර මේ ඉල් මහේ
දිනන්නට පංතියේ නිදහස
හිඳී නුඹ නොසැලී ළයේ...

*33වැනි ඉල්මහ විරු සමරුව නිමිත්තෙනි*





ගාල්ල ආසන සමුළුව මුළුදී
2022 ඔක්තෝබර් 30

# පුංචි ඡන්දය කල් නොදමනු!


මේ වන විටත් වසරකින් කල් දමනු ලැබ ඇති පළාත් පාලන මැතිවරණය 2023 වසරේ මාර්තු 20වැනි දිනට පෙර පැවැත්විය යුතුව තිබුණද සහික ධූර ප්‍රමාණය අඩු කිරීමේ උත්සාහයකට මුවා වී මැතිවරණය කල් දැමීමට ආණ්ඩුව උත්සාහ කරන බවත් එම දුෂ්ට වුවමනාව පරාජය කළ යුතු බව ප්‍රකාශ කරන ජනතා විමුක්ති පෙරමුණ, නියමිත පරිදි මැතිවරණය පැවැත්වීමට මැතිවරණ කොමිසමට ඉඩ දිය යුතුව ඇති බවත් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය යටපත් කිරීමට ඉඩ නොදෙන බවත් අවධාරණය කරයි.

පළාත් පාලන ආයතවල 8000කට වැඩි නියෝජිත සංඛ්‍යාව අඩු කළ යුතුව ඇති බව රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කර තිබූ අතර එවැන්නක් සිදු කිරීමටනම් නැවත වරක් කොට්ඨාස වෙනස් කර නව සීමා නීර්ණයක් සිදු කළ යුතුව තිබේ. මේ තත්වය තුළ ආණ්ඩුවේ උත්සාහය වන්නේ 2022 වසරේ පෙබරවාරියේ පැවති ජන මතයට බියෙන් කල් තබන ලද පළාත් පාලන මැතිවරණය නව සීමා නීර්ණයකට යාමට ගතවන කාලය පාවිච්චි කරමින් ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස තවත් කාලයකට දින නියමකින් තොරව කල් දමා ගැනීමටය.

2019දී බලයට පත් ජනාධිපතිවරයා ජනතා විරෝධයට ලක්වී ධූරය අත්හැර ගොස් තිබෙන අතර 2020 ජනවරමින් බලයට පැමිණි අගමැතිවරයාද ජන විරෝධය හමුවේ බලයෙන් පහ කරනු ලැබ ඇත. මේ වන මීට දෙවසරකට පෙර පැවති ජන මතය මුළුමනින්ම වෙනස් වී ඇති අතර වත්මන් ජනාධිපතිවරයා සහ ඔහුගේ ආණ්ඩුව කිසිදු ජන වරමක් නියෝජනය නොකරයි. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ වගන්තිවල එල්ලී බලයේ රැඳී සිටින ඔවුහු මේ වන විට පවතින දැවැන්ත ආණ්ඩු විරෝධී **02 වැනි පිටුවට**

## 03 රාජපක්ෂ දේශපාලනයේ...

දැන් පොහොට්ටුව මෙහෙය වන, නායකත්වය දෙන කෙනෙක් නැත. රාජපක්ෂවරුන් කේන්ද්‍ර කර ගනිමින් එකතු වූ පිරිස එම කේන්ද්‍රය දුර්වල වූ විට ඉන් ගැලවී ගැලවී බිඳීයාමට පටන්ගෙන...



## 05 අධ්‍යාපන ආයතන තුළ පසුගාමීත්වයට...

විශ්වවිද්‍යාල සිසුන් විදිහට පසුගාමී තත්වයන් වෙනස් කරගෙන අලුතින් උකහා ගත් දේවල් සමග ඒවාට හැඩ ගැසෙන ආකාරයට අලුත් සංස්කෘතීන් ගොඩනගා ගැනීමට...



## 09 ඉතිහාසයේ එකම දෙය...

රට දැවැන්ත සමාජ ආර්ථික දේශපාලන අර්බුදයකට ඇදදමා ඇති රාජපක්ෂලා හා රනිල් වික්‍රමසිංහලා දැන් ඔවුන් නිතර මතුරන ඔවුන්ගේම ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයට පවා බියවී...




තරුණ................................ 04
ජාත්‍යන්තර........................ 06
ආ.ර්ථිකය ......................... 07
කාන්තා............................. 08
විශේෂාංග.......................... 10
වේදිකාව............................ 11


*යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!*

# TUCC ඒකාබද්ධ ජනතා අරගලය හයිඩ් පිටියෙන් ඇරඹේ



'රාජ්‍ය, පෞද්ගලික හා වතු සියලු සේවකයින් හා විශ්‍රාමිකයින්ට ජීවත්වීමට ප්‍රමාණවත් දීමනාවක් වහා ලබාදෙනු, භාෂණයේ අයිතියට අත නොතබනු. මර්දනය වහා නවතනු, ත්‍රස්ත පනත් ඇතුළු සියලු මර්දන අණපනත් අහෝසි කරනු, තෙල්, වරාය, විදුලි, ඇතුළු රාජ්‍ය දේපළ විකිණීම වහා නවතනු, ජනතා ප්‍රශ්නවලට විසඳුම් නැති පාර්ලිමේන්තුව විසුරුවා හැර මැතිවරණයක් පවත්වනු' ඇතුළු ප්‍රධාන ඉල්ලීම් 9 ක් මුල්කරගනිමින් පසුගිය 27වැනි දින කොළඹ හයිඩ් පිටියේදී දැවැන්ත විරෝධතා රැලියක් පැවැත්විණි. ඒ, වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා ඒකාබද්ධ ජනතා ව්‍යාපාරයේ මූලිකත්වයෙන් සංවිධාන 1000 කට අධික ප්‍රමාණයක් ඒකාබද්ධ වෙමිනි. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත, වෘත්තීය සමිති සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ සමකැඳවුම්කරුවන් වන වසන්ත සමරසිංහ, උදේනි දිසානායක, සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් එරංග ගුණසේකර සහ ශිෂ්‍ය සංවිධාන, සිවිල් සංවිධාන ගණනාවක් නියෝජනය කරමින් නියෝජිතයෝ ගණනාවක් මෙම රැලිය ඇමතුහ.

# රාජ්‍ය - පෞද්ගලික සේවකයින් බදු බරට එරෙහි ක්‍රියාමාර්ගවලට



මාසික ආදායම ලක්ෂයට වැඩි සියලු දෙනා මත අධික බදු පැනවීමට ආණ්ඩුව කටයුතු කර ඇති බව වසන්ත සමරසිංහ සහෝදරයා මාධ්‍ය හමුවක් අමතමින් පැවසීය. ජනතාවගේ ආදායම තව තවත් අඩු වී ඇති තත්වයක් තුළ මෙම බදු පැනවීම ඉතා අසාධාරණ බවත් මෙම තත්වයට රට ඇද දැමූ දූෂිතයින් සඳහා කිසිදු පියවරක් ගෙන නොමැති බවත් මෙහිදී වසන්ත සමරසිංහ සහෝදරයා පැවසීය. මෙම බදු මගින් රටේ මිනිසුන් බරපතළ පීඩාවට පත්වෙද්දී මෙම දූෂිතයින් සඳහා කිසිදු බලපෑමක් නොකර ඇති බවත් ඔවුන් මෙම බදුවලින් බේරී ඇති බවත් වසන්ත සමරසිංහ සහෝදරයා පැවසීය. එබැවින් මෙම ජනතාව පීඩාවට පත්කරන මෙම දූෂිත පාලකයින්ට එරෙහිව පාරට බසින බවත් ඒ සඳහා සියලු වැඩකරන ජනතාව පෙළගස්වමින් ඇති බවත් මෙම මාධ්‍ය හමුව අමතමින් වසන්ත සමරසිංහ සහෝදරයා පැවසීය.

# දුම්රිය පොදු සේවක සංගමයේ 25වැනි සමුළුව මුළුදෙයි



සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමයේ 25වැනි වාර්ෂික සමුළුව පසුගිය 18 දින කොළඹ දුම්රිය මුලස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සමුළුව සඳහා සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් එස්.පී. විතානගේ ඇතුළු රටපුරා දුම්රිය වෘත්තීය සමිති සාමාජිකයෝ සහභාගි වූහ. මෙහිදී දුම්රිය පොදු සේවක සංගමයේ සභාපති එස්.පී. විතානගේ සහෝදරයා පැවසුවේ පසුගිය කාලයේ සියලු ආණ්ඩුවලින් දුම්රිය පෞද්ගලීකරණයට උත්සාහ ගත් නමුත් සේවකයින්ගේ දැවැන්ත විරෝධය හමුවේ එම උත්සාහයන් හකුළාගත් බවත් මේ වන විටත් රනිල් රාජපක්ෂ ආණ්ඩුව විසින් දුම්රිය විකිණීමේ කටයුතු ඉදිරියට ගැනීම අරඹා ඇති නමුත් එම උත්සාහය පරාජය කරන බවද එමෙන්ම මෙලෙස ජාතික සම්පත් විකිණන ආණ්ඩුව පලවා හැරීම සඳහා සියලු දුම්රිය සේවකයින් එක්ව ක්‍රියාමාර්ග ගන්නා බවය.

# ලංකා ගුරු සේවා සංගමයේ 25වැනි ජාතික සමුළුව මුළුදෙයි



'අයිතීන් දිනන, අරගලයට පණ පොවන, ගුරු පවුර ගොඩනගන ලංකා ගුරුසේවා සංගමයේ 25 වන ජාතික සමුළුව පසුගිය 7 දින මහරගම තරුණ සේවා සභාවේදී පැවැත්වුණි. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සමුළුව සඳහා ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ, සභාපති ධම්මික අලහප්පෙරුම, උප සභාපති ප්‍රදීපන් යන සහෝදරවරු ඇතුළුව රට පුරා සාමාජිකයෝ දහස් ගණනක් එක්ව සිටියහ. මෙහිදී ඉදිරි වර්ෂය සඳහා නව නිලධාරී මණ්ඩලය පත්කර ගනු ලැබූ අතර ඉදිරිපත් කරන ලද යෝජනා මාලාව ඒකඡන්දයෙන් සම්මත විය. මෙම සමුලුව අමතමින් ලාල්කාන්ත සහෝදරයා ප්‍රකාශ කළේ රටේ අධ්‍යාපනය ගොඩනැගීම සඳහා ගුරුවරුන් මැදිහත්වනවා සේම රටේ පාලනය වෙනස් කිරීම සඳහාද ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය මෙහෙයවිය යුතු බවත් ඒ සඳහා සංගමයක් ලෙස ලංකා ගුරුසේවා සංගමය නායකත්වය දිය යුතු බවත්ය.

## චන්දෙට බය මාමයි බෑනයි ඉතිහාසයෙන් නූගත් පාඩම්...

ජාතික ජන බලවේගය විසින් ඔක්තෝබර් 20වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලද සම්මන්ත්‍රණය

# තනි තනි සටන්පාඨ වෙනුවෙන් රංචු ගැහෙන ඊනියා සන්ධානවලට අපි නැහැ

**ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා**



'ප්‍රජාතන්ත්‍රවාදය දිනාගන්න ඡන්ද වැඩක් නැහැ, පාරේ සටන් කරමු' කියන පිරිසකුත් ඉන්නවා. ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවිරෝධී, ඒකාධිපති හිතුවක්කාරී පාලනයට තර්ජනය එල්ල කළ හැකි ප්‍රධානම මෙවලම ඡන්දයම තමයි. පාරේ අරගල කරලා පාලකයන්ට පීඩනයක් දෙමු. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත් ආණ්ඩුව අනුගමනය කරමින් තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය හැකිළීමේ ක්‍රියාමාර්ග තීරණාත්මක ලෙස පරාජය කළ හැකි වෙන්නේ මහජන මතය සාධාරණ ලෙස පිළිබිඹු කළ හැකි අවස්ථාවක් ලබාගත්තොත් පමණයි. ඒ නිසා ආණ්ඩුවේ මර්දනයට එරෙහි සටනත් ඡන්දය ඉල්ලීමේ සටනත් දෙකම එකට තිබෙන්නේ. අරගලයෙන් සිදුවුණේ භාග සටන්පාඨ ඉදිරිපත් කිරීම නිසා භාග ජයග්‍රහණයක් ලබාගැනීම පමණයි. 1982 පැවැත්වීමට නියමිතව තිබූ මැතිවරණය පැවැත්වූවානම් ඉන් පසුව සිදුවූ බොහෝ ඛේදවාචකයන් ඇති වෙන්නේ නැහැ. ජනතාවගේ සැබෑ මතයක් නැති ආණ්ඩු ව්‍යාජ මතයන් පෙන්නවලා ජනතාව පීඩාවට පත් කරනවා. රනිල් කරන්න උත්සාහ කරන්නේත් ඒ දේමයි.

මේ අතර සමහරු අපිට කියනවා ඔයාල තනියෙන් ගමණක් යනවා; ඇයි අනෙක් අයත් එක්ක එකතු වෙලා යන්න බැරි කියලා. එකතුවෙන්න කියලත් කියනවා. නමුත් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අරගලයත් මර්දනයට එරෙහි අරගලයත් ආර්ථික පරිවර්තනය කිරීම සඳහා අරගලයත් දේශපාලන පරිවර්තනය සඳහා අරගලයත් ඔක්කොම එකට ගැටගැහිලා තියෙන්නේ. ඒවා වෙන වෙනම තීරු කඩන අරගල නෙවෙයි. තනි තනි සටන්පාඨ වෙන්වෙන් රංචු ගැහෙන හුණ්ඩු සන්ධානවලට ජාතික ජන බලවේගයේ අපි යන්නේ නැති බව වගකීමෙන් කියනවා.

රනිල් වික්‍රමසිංහ රාජාසන කතාවේදී තමන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය ඉදිරිපත් කළා. ඊට පස්සේ ඒ ගැන සජබයේ ඇතැම් මන්ත්‍රීවරු කිව්වේ මොකක්ද? රනිල් වික්‍රමසිංහ ඉදිරිපත් කර තිබෙන්නේ සජබය නියෝජනය කරන ආර්ථික දේශපාලනික ප්‍රතිපත්තියම බවත් ඒකට පොහොට්ටුව පක්ෂයත් ලෙස එකඟ වෙන්නේ කොහොමද කියලත් ප්‍රශ්න කළා. ඒක හොඳ ප්‍රශ්නයක්. සජිත්ගේ මන්ත්‍රී කණ්ඩායමේ බහුතරයක් ඒ අදහසට විරුද්ධ නැහැ. මේකට හොඳම උදාහරණය වුණේ රනිල් වික්‍රමසිංහ ඉදිරිපත් කළ අතුරු අයවැය. මේ අයවැයට පක්ෂව ඡන්ද 116ක් සහ විපක්ෂව ඡන්ද 05ක් ලැබුණා. විපක්ෂව ලැබුණේ අපේ ඡන්ද 03යි පොන්නම්බලම් මහත්තයාගේ ගජේන්ද්‍ර කුමාර් මහත්තයාගේ ඡන්ද දෙකයි විතරයි. සජිත්ගේ මන්ත්‍රී කණ්ඩායම ඡන්දය දීමෙන් වැළකී හිටියා. ඒ කියන්නේ අනුමත කළා කියන එක. එහෙමනම් මේ තුන්ගොල්ලොම නියෝජනය කරන්නේ එකම ආර්ථික ප්‍රතිපත්තියක්.

එ වගේම රනිල් වික්‍රමසිංහ ඉදිරිපත් කළ සමාජ ආරක්ෂණ බද්දට පක්ෂව ඡන්ද 90ක් සහ විරුද්ධව ඡන්ද 08ක් ලැබුණා. ජනතාවට විශාල ලෙස බදු බර වැඩිවෙන පනත ගැන සජබේ නෝ කතා නෝ සිනා. මේකට විරුද්ධ වුණේ නැහැ. එකම ගමනේ යමින් ඉන්නේ. ඒ වගේම තෙල් සංස්ථාවේ ගුවන්යානා ඉන්ධන සැපයුම් අංශය පෞද්ගලීකරණය කිරීමේ පනත ගෙනාවා. ඩොලර් හොයාගන්න තිබුණ මාර්ගය අහිමි වෙනවා. ඒක අපරාධයක්. නමුත් පාර්ලිමේන්තුවේදී පනතට පක්ෂව ඡන්ද 77ක් ලැබුණා. විපක්ෂව ලැබුණේ 17යි. සජිත්ලා, ඩලස්ලා හිටියේ කොහෙද? විමල්ලා ගැන කතා කරල වැඩක් නැහැ. ශ්‍රී ලංකා එකේ වෘත්තීය සමිතියත් මේ පනතට විරුද්ධයි. නමුත් මෛත්‍රීපාලගේ පිරිස පාර්ලිමේන්තුවේදී නිහඬයි. සමගි ජන බලවේගයේ වෘත්තීය සමිතියත් මේ පනතට විරුද්ධයි. නමුත් පාර්ලිමේන්තුවේදී සජබය නිහඬයි. නමුත් සංස්ථාව තුළදී අපේ වෘත්තීය සමිතිය ඊට විරුද්ධයි වගේම පාර්ලිමේන්තුව තුළදීත් අපි ඊට විරුද්ධව ඡන්දය දුන්නා. මෙකෙන් පැහැදිලි වෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පවත්වාගෙන යන්න බැරි තරමට විනාශයක් අත්කරදුන් මේ ආර්ථික මාවතට ඒ සියලුදෙනාම පක්ෂ බවයි. ඒ නිසා ජාතික ජන බලවේගයේ අපිට ඒ කණ්ඩායම් සමඟ එකට ගමනක් නැහැ.

**මර්දනකාරී පාලනයක් ගොඩනැගෙන්නේ මේ ආර්ථික පීඩනයට එරෙහිව නැගී සිටින ජනතාව මර්දනය කරන්න. ජනතාව පීඩාවට පත්කරන ආර්ථික උපායමාර්ගයට පාර්ලිමේන්තුවේදී අත උස්සා හෝ නිහඬව සිටීමෙන් අනුමැතිය ලබාදී එයින් පිටත ප්‍රජාතන්ත්‍රවාදය දිනාගන්න එකතුවෙන්න කියන කතාව සම්පූර්ණයෙන්ම ව්‍යාජයක්. ඒ බොරුවළවල්වලට ජාතික ජන බලවේගය වැටෙන්නේ නැහැ.** ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ආර්ථික නිදහස පිළිබඳව, දේශපාලන නිදහස පිළිබඳව සහ සමාජ පරිවර්තනයක් පිළිබඳව කිසිදු සම්මුතිවාදී එකඟතාවයක් ජාතික ජන බලවේගයේ අපිට ඔවුන් සමඟ නැහැ. ඕනෑ කෙනෙක් මර්දනයට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම ගැන අපේ කිසිදු විරෝධයක් නැහැ. නමුත් ප්‍රජාතන්ත්‍රවාදය දිනාග ැනිමේ සටනත් ආර්ථික පරිවර්තනය පිළිබඳ සටනත් ඒකාබද්ධව මෙහෙයවීම ජාතික ජන බලවේගයේ සටන්පාඨයයි. අපේ ශක්තිය මදිනම් අපි වඩා හොඳින් සංවිධානය වෙමින් ශක්තිය වැඩි කරගන්නවා මිස බොරු වළවල්වල වැටෙන්නේ නැහැ.

# පුංචි ඡන්දය...

01 පිටුවෙන්

ජන මතයට බිය ගෙන සිටිති. ජන වරමක් රහිතව බලයට පත් ජනාධිපතිවරයා තමන්ට ජනතාව හමුවට යා නොහැකි බව දන්නා අතර ආණ්ඩුවේ ප්‍රධානතම පක්ෂය වන පොදු ජන පෙරමුණ 'මහින්ද සමග නැගිටිමු' යනුවෙන් සටන්පාඨයක් යොදා ගනිමින් රැස්වීම් කිහිපයක් සංවිධානය කළද පවතින ජන මතයට බිය ගෙන සිටියි. මේ තත්වය තුළ ඔවුන්ට අවශ්‍ය වී ඇත්තේ, පළාත් පාලන මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පාර්ලිමේනතු මැතිවරණය ඇතුළු ජන මතය උරගා බැලීම් හැකිතාක් කාලයකට කල් දමා ගැනීමටය.

මේ පිළිබඳව නියමුවා කරන ලද විමසීමකට පිළිතුරු දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, විවිධ ව්‍යාජ කරුණු දැක්වීම් මගින් ජනතාවගේ පරමාධිපත්‍ය බලය පාගා දැමීමට ආණ්ඩුවට කිසිසේත් ඉඩ නොදිය යුතු බවත් මැතිවරණ කල් දැමීමේ ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී උත්සාහයට එරෙහිව සිවිල් හා බහුජන සංවිධාන සමග එක්ව සටන් වදින බවත් එම දුෂ්ට ප්‍රයත්නය පරාජය කිරීමට කටයුතු කරන බවත් අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ සටනේ බොරු වළවල්!

දැන් ජනතාව දිවි ගෙවමින් සිටින්නේ ලංකාව ආර්ථික, සමාජ, දේශපාලන හා සංස්කෘතික යන හැම අංශයකින්ම කඩා වැටුණු විපත්තිදායක කාල පරිච්ඡේදයකය. ආර්ථික අර්බුදයේ බරපතළකමත්, ඉන් පීඩාවට පත්වන ජනයා තම අයිතීන් වෙනුවෙන් ආණ්ඩුවට එරෙහිව නිතර පාරට බැසීමත් නිසා එය වැළැක්වීමේ අරමුණින් රනිල් - රාජපක්ෂ ආණ්ඩුව විසින් මර්දනයක් හා සියුම් දඩයමක් දියත් කරනු ලැබ තිබේ. එය රටේ ප්‍රජාතන්ත්‍රවාදයට අනතුරකි.

එසේම ආණ්ඩුව කෙරේ පවතින මහජන අප්‍රසාදය හා විරෝධය නිසාත්, ආණ්ඩුවේ දේශපාලන අර්බුද නිසාත්, මැතිවරණවලට මුහුණ දීමට බියවී සිටින ආණ්ඩුව 2023 මාර්තුවල අනිවාර්යයෙන් පැවැත්විය යුතු පළාත් පාලන මැතිවරණය නොපවත්වා එය කල් දැමීමේ දේශපාලන සටකපටකමක, කුමන්ත්‍රණයක නියැලෙමින් සිටින බවද පෙනේ. එම කරුණ අනුව ගත් විටද රටේ ප්‍රජාතන්ත්‍රවාදය අභියෝගයට ලක්ව තිබේ.

ප්‍රජාතන්ත්‍රවාදය හා මර්දනය මූලික කරගනිමින් එය අනෙක් ප්‍රශ්නවලින් වෙන්කොට පරාජය කිරීම සඳහා බලවේග එකතු කිරීමේ වෑයමක්, මේ තත්වය මත මතුවෙමින් තිබෙන බවද පෙනේ. ප්‍රජාතන්ත්‍රවාදය දිනා ගැනීම, රැකගැනීම හා ඒ වෙනුවෙන් සටන් කිරීම ඉතාම හොඳ කාර්යයක් වුවත් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සටනේ තිබිය හැකි 'බොරු වළවල්' හඳුනා නොගන්නේ නම් සටන් කරන බලවේග අනතුරට පත්වේමේ හැකියාවක්ද තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ සටන් පාඨය තුළ තිබිය හැකි 'බොරු වළවල්' හඳුනාගත යුත්තේ මේ නිසාය.

එක් ධනපති පාලනයක් දුර්වලවන විට ඊට එරෙහි අනෙක් ධනපති කඳවුර වටා බලවේග පෙළගස්වා ගැනීමට හැමදාමත් යොදාගත් පහසු සටන් පාඨය වූයේ 'ප්‍රජාතන්ත්‍රවාදය'ය. ගෙවුණු ඉතිහාසය දෙස බැලීමේදී මෙය පැහැදිලි වේ.

ආර්ථික ප්‍රතිපත්ති, සමාජ දේශපාලන ප්‍රතිපත්ති මුල්කර ගනිමින් විවිධ බලවේග හා කණ්ඩායම් එකතුකොට එක්තැනකට එකතු කිරීම දුෂ්කරය. මන්ද එයට ආර්ථික, දේශපාලන ප්‍රතිපත්ති පිළිබඳ විවිධ කණ්ඩායම්වල පවතින වෙනස්කම් ගැටෙන නිසාය. එහෙත් එවැනි ප්‍රතිවිරෝධයක් නොමැතිව පහසුවෙන් විවිධ කණ්ඩායම් හා සංවිධාන එක් පෙරමුණකට එකතු කිරීමේදී පහසුම සටන් පාඨය ප්‍රජාතන්ත්‍රවාදය වන නිසාත්, එය පෙන්වා ජනතාව 'බියවැද්දීම' පහසු නිසාත් ධනේශ්වර පක්ෂ හැමවිටම එම සටන් පාඨය වටා ජනතාව හා විවිධ කණ්ඩායම් එකතු කර ගැනීමට උත්සාහ දරයි. මේ මොහොතේද එවැනි උත්සාහයන් ලාංකේය දේශපාලනය තුළ මතුවෙමින් තිබේ.

පොහොට්ටුවේ දේශපාලනය තුළ සිටි, ජනතාව රැවටීමට ලක්කළ ඩලස් අලහප්පෙරුම ඇතුළු ඉන් ඉවත්වූ පිරිස, පසුගිය දිනෙක පළාත් පාලන මැතිවරණය කල් දැමීමට එරෙහිවත් මර්දනයට එරෙහිවත් සියලු පක්ෂවල සාකච්ඡාවක් කැඳවා ක්‍රියාමාර්ගද යෝජනා කළේය. එයට සජිත්ගේ ස.ජ.බ.ය මෙන්ම අති වාමාංශික කල්ලිද සම්බන්ධ විය. ඉන්පසුද ස.ජ.බ. ප්‍රජාතන්ත්‍රවාදය හා මර්දනය මූලික කරගෙන ගොඩනැගෙන එකතූන්වලට කැමැත්තෙන් සහභාගි වන බව පෙනුණි. ඒ ඇයි?

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් මෑතක ඉවත්වූ සියලු කල්ලි කණ්ඩායම් මෙන්ම ස.ජ.බ.යද මේ සිදු වී තිබෙන බරපතළ සමාජ ආර්ථික ව්‍යසනයට සෘජුවම වගකිව යුතුය. අනෙක් අතට දැන් රනිල් - රාජපක්ෂ පාලනය අනුගමනය කරන ආර්ථික ප්‍රතිපත්තිවලට වඩා වෙනස් ප්‍රතිපත්තියක් ඔවුනට ඇත්තේද නැත. රනිල් පසුගිය කාලයේ ගෙන ආ පුංචි අයවැයට විරුද්ධ නොවීම හා රනිල් මෑතක ගෙන ආ ඛනිජ තෙල් සංස්ථාව විනාශ කිරීමේ (විකිණීමේ) පනතට විරුද්ධ නොවීම තුළින්ද සජිත් පෙන්වා ඇත්තේ එම සත්‍යයමය.

ඒ නිසා වෙනස් සමාජ ආර්ථික වැඩපිළිවෙළක් මූලික කරගෙන බලය ඉල්ලීමට ඔවුනට නොහැක. කාටත් ගැලපෙන කවුරුත් 'බොරු වළේ' දාගත හැකි ප්‍රජාතන්ත්‍රවාදය නැමති සටන් පාඨයට පමණක් ඔවුන් සීමාවන්නේ ඒ අනුවය.

මොවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයද වංචාවකි. පසුගිය කාලයේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය යන්තමින් හෝ තහවුරු කිරීමට සම්මත වූ 17 හා 19වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධන දෙකටත් එසේම ප්‍රජතන්ත්‍රවාදයට හානිකරමින් සම්මත වූ 18වැනි හා 20වැනි සංශෝධන දෙකටත් මෑතදී සම්මත වූ 22වැනි සංශෝධනයටත්, එනම් ප්‍රතිවිරුද්ධ සංශෝධන පහටම පාර්ලිමේන්තුවේදී අත එසවූ මන්ත්‍රීවරු කිහිපදෙනා අතර ඩලස් අලහප්පෙරුමද වේ. ඩලස්ලාගේ අවස්ථාවාදය ඉන් හොඳින් පෙනේ.

සජිත්ලා, ඩලස්ලා වැනි අය තබාගෙන දිනාගත හැකි ප්‍රජාතන්ත්‍රවාදයක් නැත. මේ ඔවුන් සූදානම් වන්නේ තම දේශපාලන බංකොලොත්කම වසාගෙන ඊළඟ බල ව්‍යාපෘතියට පාරක් කපා ගැනීමය. ඊනියා වාමාංශික පෙනුමකින් යුත් කුඩා ප්‍රතිවිප්ලවවාදී කල්ලිද සජිත්ලා, ඩලස්ලා සමග එකට ලැගීමද පුදුම විය යුතු නැත. ඔවුන්ගේ අරමුණ දැනට ශක්තිමත් වෙමින් තිබෙන මහජන ව්‍යාපාරය වූ ජාතික ජන බලවේගයේ ගමනට බාධාකිරීමය.

දැන් ආර්ථික, සමාජ අර්බුදයෙන් වෙන් කර, ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය දිනාගත නොහැක. මන්ද ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කිරීම ධනවාදයේ සමාජ ආර්ථික අර්බුදයේම ප්‍රතිඵලයක් වන නිසාය. පවතින ධනවාදී පාලනය මෙසේ තිබියෙදී, රනිල් - රාජපක්ෂ පාලනය පරාජය නොකර ප්‍රජාතන්ත්‍රවාදය පමණක් සඳහා අටවන සටන් පෙරමුණු යනු බොරු වළවල්ය. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමේ සැබෑ මඟ වැටී ඇත්තේ පවතින පාලනය පරදා නව ජනතාවාදී පාලනයක් ගොඩනැගීම සඳහා වන ක්‍රියාවලියක් තුළ පමණක් බව අවසාන වශයෙන් අවධාරණය කළ යුතුය.

# රාජපක්ෂ දේශපාලනයේ ගමනක අවසානය!

ලංකාවේ ධනපති ක්‍රමයේ පසුගාමිත්වය හා බැඳුණු ලාංකේය ධනපති දේශපාලනය දිගටම ගමන් කළේ අර්බුදය මැදය. එය කුමන්ත්‍රණ, ඝාතන, පක්ෂවලින් කැඩීයාම් ආදී අර්බුද රැසක් මැද ගමන් කළද සමහර ධනේශ්වර ආචාර ධර්මයන් නොබිඳ සිටීමටද ප්‍රවේසම් වූ බව අතීතය දෙස බලන විට පෙනේ. ලංකාවේ ධනපති ක්‍රමයේ දේශීය ධනපති පංතිය බලය හෙබවූ මුල් දශක දෙකක තුනක කාලය තුළ මෙරට ප්‍රභූ පංතිය තම ධනය දේශපාලන බලය දිනාගැනීම සඳහා යොදා ගත්තද තම දේශපාලන බලය ධනය ඉපයීම සඳහා යොදාගත්තේ එක්කෝ අඩුවෙනි; නැතිනම් නොපෙනෙන ලෙස පරිස්සමෙනි.

එහෙත් ලාංකේය දේශපාලනයේ ධනේශ්වර ආචාරධර්ම පවා උඩුයටිකුරු කරමින් ජාවාරම්කාරී දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරනු ලැබුයේ රාජපක්ෂ කණ්ඩායම විසිනි. මෙහි ආරම්භකයා ජේ.ආර්. ජයවර්ධන වුවද, වංචා, දූෂණ, හොරකම් පිරි ජාවාරම්කාරී දේශපාලන සංස්කෘතියේ කූටප්‍රාප්තිය සිදුකළේ රාජපක්ෂ පවුල විසිනි. ඒ සඳහා ඔවුන් විසින් බොරු සිංහල, බෞද්ධ ප්‍රතිරූපයක් ගොඩනැගූ අතර 30 වසරක යුද්ධයේ ජයග්‍රහණයද යොදාගනු ලැබීය.

රාජපක්ෂවරු දේශපාලන පක්ෂයක් ගොඩනගා එයට බලය ගැනීම වෙනුවට ප්‍රභූ පෙනුම සහිත, වැඩවසම් මානසිකත්වය සහිත තම පවුල වටා විශාල පිරිසක් එකතු කළෝය. ඔවුන් බලය ගත්තේ එම කණ්ඩායමටය. ඒ අනුව විධිමත් පක්ෂයක් වෙනුවට අනුහස් සහිත නායකයෙක් වටා පෙළගැසුණු යටත්වැසියන් රැසක් සහිත බලයක් නිර්මාණය කරන ලදී. ශ්‍රීල.නි.ප.යෙන් ඉවත්වී මහින්ද රාජපක්ෂලා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ගොඩනඟන විට එය සංවිධාන ව්‍යුහයක් සහිත, ව්‍යවස්ථාවකට අනුව කටයුතු කරන 'පක්ෂයක්' වූයේ නැත. එය රාජපක්ෂලා වටකරගත් පිරිසක් බවට පත්විය.

රාජපක්ෂලා දේශපාලන සදාචාරයත්, ලැජ්ජාව, බිය පසෙක දමා මහ දවාලේ මහජන මුදල් හොරකම් කරමින්, වංචා, දූෂණ, කොමිස් හා කප්පම් මඟින් ධනය ගොඩගසමින් ධනවාදය තුළ පැරණි ප්‍රභූ පවුල් පාලනයක සංස්කෘතිය නිර්මාණය කළෝය. රාජපක්ෂ පාලනය හා සම්බන්ධ වූ සැමදෙනාගේම 'ජීවිතය' වූයේ වංචා, දූෂණ මඟින් ධනය ඉපයීමය; තව තවත් ධනය ඉපැයීමය. වර්තමානයේ ලංකාවේ පවතින අති බිහිසුණු ආර්ථික අර්බුදයට මඟ පෑදූ එක් ප්‍රබල හේතුවක් වූයේද එයයි.

2019 ගෝඨාභය රාජපක්ෂ මුල්කරගෙන ගොඩනැගූ පාලනය රාජපක්ෂවරුන්ගේ බලයේ කූටප්‍රාප්තිය සනිටුහන් කළේය. එහෙත් ධනවාදයේ පොදු අර්බුදයත්, ගෝඨාභය රාජපක්ෂ ගත් වැරදි ආර්ථික තීරණත් ඔහුගේ හා එම පාලනයේ මෝඩ උද්ධච්ඡ හැසිරීමත් විසින් 'පුදනකොටම කාපි යකා' කීවාක් මෙන් දැවැන්ත ආර්ථික අර්බුදයක් නිර්මාණය විය. එහි ප්‍රතිඵලය වූයේ රාජපක්ෂවරුන්ට අන්ධභක්තියෙන් ආදරය කළ ජනතාවම කෝපයට පත්ව ඔවුන් පලවා හැරීමට පාරට බැසීමය. අවසානයේ සිය



පාලනයට වසර දෙකහමාරක් පිරෙන්නටත් මත්තෙන් ජනාධිපතිකම අතහැරීමට ගෝඨාභයටත් අගමැතිකම ඇතුළු ඇමති තනතුරු අතහැර තිරය පිටුපසට යාමට රාජපක්ෂලාටත් සිදුවිය.

මෙහිදී ඔවුන් සිය පවුලේ ආරක්ෂාවත්, පැවැත්මත්, තම පාලනයේ පැවැත්මත් සඳහා තෝරාගනු ලැබුවේ ජනපදනමක් නොතිබූ පාර්ලිමේන්තුවේ එක් මන්ත්‍රී ධුරයක් පමණක් තිබූ තම ප්‍රතිවාදියා ලෙස අර්ථ ගන්වා සිටි රනිල් වික්‍රමසිංහය. රාජපක්ෂලා ගණන් බැලුවේ ජන බලයක් හෝ මන්ත්‍රී බලයක් නැති රනිල් තම පවුලේ පාලනයට අභියෝගයක් නොවෙනු ඇත කියාය. එහෙත් දැන් රනිල් වික්‍රමසිංහ කුඩාරමට හිස ඇතුල් කරගත් ඔටුවා පසුව මුළු කුඩාරමම අත්පත් කර ගත්තාක් මෙන් ආණ්ඩුවේ බලය තමන් අතට ගනිමින් සිටී. ඒ සඳහා ඔහුට ලොකුම පහසුව වී ඇත්තේ රාජපක්ෂ පවුල බිඳ වැටෙමින් තිබීමය.

පංතියේ බලය සඳහා පංතියේ සංවිධාන ලෙස විධිමත් පක්ෂයක් ගොඩ නඟනවා වෙනුවට පවුල වටා පිරිසක් එකතු කර ගැනීමේ දේශපාලන වැරැද්ද වෙනුවෙන් දැන් රාජපක්ෂවරු වන්දි ගෙවමින් සිටිති. මේ වන විට රාජපක්ෂවරුන්ට සමාජයේ තිබෙන

> නව දැන් පොහොට්ටුව මෙහෙය වන, නායකත්වය දෙන කෙනෙක් නැත. රාජපක්ෂවරුන් කේන්ද්‍ර කර ගනිමින් එකතු වූ පිරිස එම කේන්ද්‍රය දුර්වල වූ විට ඉන් ගැලවි ගැලවී බිඳීයාමට පටන්ගෙන තිබේ. එය අරුමයක්ද නොවේ. එය හරියටම ගොනුන් බැඳ තිබූ කණුව දිරාපත්ව කැඩී ගිය විට, ගොනුන් හිස හැරුණු අතේ යාමක් වැනිය.

විශාල විරෝධය නිසාත්, රාජපක්ෂවරු දේශපාලන වශයෙන් බංකොලොත් වී තනතුරු රහිතව සිටීම නිසාත්, මහින්ද තවදුරටත් නායකත්වය දිය නොහැකි ලෙස දුබලවී සිටීම හා වෙනත් රාජපක්ෂ කෙනෙක් අනුහස් සහිතව ගොඩනැගී නොතිබීම නිසාත් 'පොහොට්ටුව' බිඳීයාමට, දියවීමට පටන්ගෙන ඇත. එහි වාසිය ගනිමින් සිටින්නේ 'කපටි ආරක්ෂකයා' වූ රනිල්ය.

පසුගිය මැතිවරණ සමයේ රාජපක්ෂලාගේ බල ව්‍යාපෘතිය වෙනුවෙන් රාජපක්ෂලාගේ ප්‍රතිරූපය පිම්බීමේ කොන්ත්‍රාත්තුව ඉටුකළ වීරවංශ, ගම්මංපිල, වාසු ඇතුළු කණ්ඩායම පොහොට්ටුව හැරදා ගොස් දැන් මාස ගණනකි. එයද ප්‍රතිපත්ති මත නොව, ආණ්ඩුවට එරෙහිව නිර්මාණය වූ මහා ජනතා විරෝධයෙන් තමතමන් ගැලවීම සඳහාය. ඉන්පසු ජනාධිපති තෝරා ගන්නා පාර්ලිමේන්තු ක්‍රියාවලියෙන් පසු, ජනාධිපති තනතුරට තරග කර පරාජය වූ ඩලස්, ජී.ඇල්. පීරිස් ඇතුළු 13 දෙනෙක් පොහොට්ටුවෙන් ඉවත්ව විපක්ෂයේ වාඩි වූහ.

දැන් නවතම තොරතුරු අනුව පොහොට්ටුව කැලි ගණනාවකට කැඩීයමින් එහි මධ්‍යගතභාවය අහෝසි වී තිබේ. දැන් පොහොට්ටුව මෙහෙය වන, නායකත්වය දෙන කෙනෙක් නැත. රාජපක්ෂවරුන් කේන්ද්‍ර කර ගනිමින් එකතු වූ පිරිස එම කේන්ද්‍රය දුර්වල වූ විට ඉන් ගැලවි ගැලවී බිඳීයාමට පටන්ගෙන තිබේ. එය අරුමයක්ද නොවේ. එය හරියටම ගොනුන් බැඳ තිබූ කණුව දිරාපත්ව කැඩී ගිය විට, ගොනුන් හිස හැරුණු අතේ යාමක් වැනිය.

පොදුවේ ගත් කල දැන් බිම් මට්ටමේ ජනතාව හැරයාම නිසාත්, මුදුනේ රාජපක්ෂ බලය දුර්වලවීම නිසාත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බිඳී යාමට පටන්ගෙන ඇත. එය පක්ෂයක් ලෙස ගොඩනගා නොමැති නිසා මෙම බිඳීයාම් නතරකර ගත නොහැකි වනු ඇත. එසේ වනුයේ මෙවැනි පිරිසක් එකට තබාගත හැක්කේ 'බලය' යන සාධකය මත පමණක් නිසාත් දැන් රාජපක්ෂවරුන් වෙත 'බලය' නැති නිසාත්ය. එහි වාසිය රනිල් වික්‍රමසිංහ ලබාගනිමින් සිටින බවද පෙනේ.

පසුගියදා සම්මත වූ 22 සංශෝධනය නිසාද මෙම දියවීම තවත් හොඳින් පෙනුණි. සම්මත වූ 22 සංශෝධනයට අනුව ද්විත්ව පුරවැසියන්ට මහජන නියෝජිතයන් ලෙස කටයුතු කළ නොහැක. ඉන් සිදුවන්නේ පොහොට්ටුව තුළ බැසිල්ගේ භූමිකාව දුර්වලවීමය. අනෙක් අතට පාර්ලිමේන්තුවට වසර දෙකහමාරක් පිරුණ විට එය විසුරුවා හැරීම සඳහා ජනාධිපතිවරයාට ඇති බලය 22 තුළත් තබාගැනීමට රනිල් කටයුතු කළේය. ඒ අනුව ලබන මාර්තුවලින් පසු පාර්ලිමේන්තුව රනිල්ට විසුරුවා හැරීමට හැකි නිසා ආණ්ඩුවේ මන්ත්‍රී කණ්ඩායම රනිල්ගේ 'ප්‍රාණ ඇපකරුවන්' බවටද පත්වේ. 22වැනි සංශෝධනයෙන් ඉහත කරුණු දෙක වෙනස් නොකරන්නේ නම් එයට ඡන්දය නොදෙන බවට පොහොට්ටු ලේකම් ඇතුළු පිරිස තර්ජනය කළද අවසානයේ 'ආණ්ඩුවේ සමගිය' රැක ගැනීම වෙනුවෙන් 22ට ඡන්දය දීමටද ඔවුනට සිදුවිය.

මේ සියලු කරුණුවලිනුත් මෑතදී 'මහින්ද සමග නැගිටීමට' සමහරු දැරූ උත්සාහය අසාර්ථක වීම විසිනුත් පෙන්වන්නේ ඉතිහාසයේ එක මොහොතක බලය වෙනුවෙන් ඇටවූ රාජපක්ෂ කඳවුර එහි මුදුන දුර්වල වී විසිරෙමින්, දියවෙමින් යන බවය. එහෙත් එය යළි ශ්‍රීලං.නි.ප.ය ශක්තිමත් කිරීමට හේතුවක් වීද නැත. සජබ හෝ එජාප වෙත ද ජනතා සහය නැත. පාර්ලිමේන්තුවේ සියලු ධනපති දේශපාලන පක්ෂ කැඩී බිඳී දුර්වලව පවතින අතර ඔවුනට මුක්කු ගැසූ කුඩා කණ්ඩායම්ද දේශපාලන බිමේ අනාථවී සිටී. මේ සියලු තත්වයන් තුළ බිම් මට්ටමේ ජනයා ජාතික ජන බලවේගය වෙත ඇදෙමින් සිටී.

අවසාන වශයෙන් රට විනාශ කරමින් රාජපක්ෂ කඳවුරද විනාශ වීමේ අනතුරට මුහුණ දී සිටින බව කිව යුතුය. රාජපක්ෂවරුන්ගේ දේශපාලනයේ ගමනක අවසානය දැන් රට අත්දකිමින් සිටී.

ධනපති ක්‍රමයේ අර්බුදයත්, විශාලතම ආර්ථික අර්බුදයත් එහිම ප්‍රතිඵලයක් ලෙස ධනේශ්වර දේශපාලන ධාරාවත් මුහුණදී ඇති අර්බුදයත් විසින් නව දේශපාලන ව්‍යාපාරයකට, නව දේශපාලන සංස්කෘතියකට, නව දේශපාලන ආර්ථික වැඩපිළිවෙළකට සමාජය තුළ ඉඩ විවර වී තිබේ. මේ මොහොතේ එම හිඩැස පිරවිය හැක්කේ මහජන ව්‍යාපාරයක් ලෙස ජාතික ජන බලවේගයට පමණක් බව ඉතා පැහැදිලිය.




# ඊළඟ දොරටුව...

ජනතා කැමැත්ත විමසීම ඇත්ත ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි. නමුත් ධනවාදය ඇත්ත ජනතා කැමැත්තට ඉඩහසර විවර නොකරයි. මන්දයත්, ඇත්ත ජනතා කැමත්ත ඔවුන්ගේ පැවැත්මට අහිතකර වන බැවිනි. මෙනිසා ධනවාදය තමන්ගේ පැවැත්මට අවැසි ජනතාවක් නිර්මාණය කරගැනීමට වෙහෙස වෙයි. ඒ වෙනුවෙන් අධ්‍යාපනය, මාධ්‍ය, නීති, ආරක්ෂක අංශ, ආගමික ආයතන වැනි බොහෝ දේ යොදාගනී. වසර 74ක් අඛණ්ඩව අපේ රටේ ධනවාදය විසින් සිදුකරමින් පවතින්නේද තම පංතියේ පැවැත්මට හානියක් නොවන, ඔවුන්ට වාසිදායක අවස්ථාවක් බලා ජනතා කැමැත්ත උරගා බැලීමය. ඉතිහාසයක් පුරාවට සිදුවූයේ එයය

අදද ඔවුහු එවන් අවස්ථාවක් එන තුරු කල්මරමින් සිටිති; ඒ කාලය ප්‍රයෝජනයට ගනිමින් ගිලී ඇති ආර්ථික අර්බුදයට තාවකාලික පැලස්තර අලවමින් සිටිති. දේශපාලන අස්ථාවරත්වය ස්ථාවර කර ගත්තා යැයි පෙන්වීමට ව්‍යවස්ථාවට කෑලි මුට්ටු කෙරෙමින් ඇත. ඒ කොතෙක්ද යත්, දැන් ව්‍යවස්ථාව, විසි එක්වතාවක් අණ්ඩ දැමූ යට කලිසමක් වැනිය.

මෙසේ කල්මැරීම තුළ ඔවුන්ගේ දේශපාලන වුවමනාවන්ට ඉඩ විවර වනු ඇතැයි ඔවුහු කල්පනා කරති; ඒ වෙනුවෙන් සූදානම් වෙති. මහින්ද සමඟ "යළි නැගිටින්නට" වෙර දරන්නේ ඒ අවස්ථාව මනාවට ප්‍රයෝජන ගනිමිනි. ටිපර් රථවලට මුවා වී සමුළු පවත්වන්නේ මේ කාලය අවස්ථාවෙන් සුළු හෝ ප්‍රයෝජනයක් ගැනීමටය. හිටපු ජනාධිපති ගෝඨාභයට වැරද්ද පරවමින් ජනතාවගෙන් සමාව අයැද සිටින්නාක් මෙන් රඟපාන්නේද මේ කාලය තුළ ජනතාව අතරට යෑමටය. හදවතේ පොහොට්ටුව තිබුණද දේශපාලන වෙනස්කම් කල්තියා දැනගෙන, පොහොට්ටුවෙන් එළියට පැනගත් වීරවංශලා, ගම්මන්පිලලා, මෛත්‍රීපාලලා වැනි කේවට්ටයින් දැන් කුමන හෝ නමකින් ජනතාව අතරට යෑමට උත්සාහ දරන්නේ, මේ කාලය ප්‍රයෝජනයට ගනිමින්, "ජනතා කැමැත්තට ඉඩ ලබාදෙන ලෙස" ඉදිරියට දමාගත් ඊනියා සටන් පාඨයද මූලික කරගනිමිනි.

මෙසේ "ජනතා කැමත්ත" යන ධනවාදයේ ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයට ඉඩ ලබගන්නා ධනවාදයේ කල්මැරීම නිවැරදිව අප හඳුනාගත යුතුය. ඔවුන් සැරසෙන්නේ ඔවුන්ට වාසිසහගත තත්වය එන තෙක් ආර්ථික විජ්ජා හා දේශපාලන ගේම් තුළින් තම පැවැත්ම සාදා ගැනීමය.

නමුත් යථාර්ථය තුළ රට පත්ව ඇති ආර්ථික අර්බුදයට ධනවාදය සතුව පිළිතුරු නැත. ඇත්තේ අධිරාජ්‍යවාදයට යටත්වීම පමණි. දැන් එය සිදුකරමින් සිටී. අයි.එම්.එෆ්. පදයට නටමින් ඔවුන්ගේ ආර්ථික කොන්දේසි නැමති ආර්ථික උගුලේ සිරකරුවන් වෙමින් සිටිති. ඒ උගුලේ සිරකරුවන් බවට ජනතාව පත්කරමින් බදු බර ජනතාවටම පටවමින් ඇත. රටේ සම්පත් බහුජාතික සමාගම් සතු කිරීමට එකඟ වී ඇත. බලශක්තිය පමණක් නොව රාජ්‍ය බැංකු පද්ධතිය පවා පුද්ගලීකරණය කරමින් මුළු රටම සිරගෙයක් බවට පත් කරමින් ඇත. ඇත්ත යථාර්ථය එයයි.

මේ නිසා මෙම ආර්ථිකය විජ්ජාවලට හා දේශපාලන ගේම්වලට මුලා නොවී, ජනතාවගේ කැමැත්ත යැයි ඔවුන් විමසන ධනවාදයේ ඊනියා අවස්ථාවන් වෙනුවෙන් බලා සිටිනවා වෙනුවට, මෙම කාලය මනාව ප්‍රයෝජනයට ගනිමින්, "ඇත්ත ජනතා කැමැත්ත" පාරට කැඳවන ජනතා අරගලයක් වෙනුවෙන් පංතිය පෙළගැස්වීම, සංවිධානය කිරීම මේ මොහොතේ අප සතු වගකීමය!

# උද්ඝෝෂණයට පහරදුන් පොලීසියට තනි තනියම නඩු



පසුගිය සැප්තැම්බර් 24 සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කළ විරෝධතා පාගමනට පොලිසිය නිර්ලජ්ජිත ලෙස ප්‍රහාරයක් එල්ල කළේය. මෙහි දී පුද්ගලයින් 84 දෙනෙකු අත්අඩංගුවට පත් වූ අතර 6දෙනෙකු රෝහල් ගත කෙරිණි. මෙම අත්අඩංගුවට ගත් අය අතරින් පිරිසකට පොලීසිය විසින් පහරදීම් සිදු කර ඇති අතර ඒ සඳහා ඔවුහු වෛද්‍ය පරීක්ෂණයකටද යොමු කරන ලදහ. පොලීසියේ මෙම අත්අඩංගුවට ගැනීමට නීතිමය වලංගුභාවයක් නොමැති බවත් ආණ්ඩුව ක්‍රම ව්‍යවස්ථාව අනුව ඔවුන්ගේ අයිතිවාසිකම් පොලීසිය විසින් උල්ලංඝණය කර ඇති බවත් නිතීඥවරු පැහැදිලි කළහ.

පොලීසියේ මෙම නිති විරෝධී ක්‍රියාදාමයට එරෙහිව සමාජවාදී තරුණ සංගමය ඔක්තෝබර් 19, 20, 21 දිනයන්හි පෙත්සම් තුනක් මානව හිමිකම් කොමිසමට හා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කළේය. පහරකෑමට ලක්වූවන් විසින් තම මානව හිමිකම් උල්ලංඝනය වීම පිළිබඳ පරීක්ෂණයක් කරන ලෙස මානව හිමිකම් කොමිසම වෙත බාරදුන් පෙත්සමෙන් ඉල්ලා සිටින ලදී. පසුව පහරකෑමට ලක් වූ නීතිඥවරුන් විසින්ද ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සමක් බාරදෙන ලදී. මෙම සිදුවීමෙන් රෝහල් ගත වූවන් විසින් පසුගිය 21වැනි දින ශ්‍රේෂ්ඨාධිකරණය වෙත බාරදුන් පෙත්සම විශේෂ වූවක් විය. එම පෙත්සම්කරුවෝ පහරදීමට වගකිව යුතු සියලු පොලිස් නිලධාරීන්ට එරෙහිව තනි තනිව පෙත්සම් ගොනු කළහ. එහිදී ඔවුන්ගෙන් රුපියල් කෝටියක වන්දි මුදල් ලබාදෙන ලෙස පෙත්සම්කරුවෝ ඉල්ලා සිටියහ. මෙහිදී පොලිස් නිලධාරීන්හට නඩුවට අදාළ වියදම් පුද්ගලිකව දැරීමට සිදුවන බවත්, එක එක දේශපාලකයන්ගේ වුවමනාව මත මෙවැනි ක්‍රියාකලාපයන් සිදුකළද නඩු සඳහා ඔවුන් සහ පොලිස් දෙපාර්තමේන්තුව ලෙස මැදිහත් නොවන බවත් එම නිලධාරීන් දැන ගත යුතු බව මෙම අවස්ථාවට සම්බන්ධ වූ නිතීඥවරු පෙන්වා දුන්හ.




# රතු හිරු නැගෙන නුබ...

ගැබ ඉරා අඳුරු පට
රතු සේල මෙනි පෙරඹර
අරුණ ගිනි දල්වා
වෙහෙසින්
නවහිරු නැගෙයි සතොසින්
නුඹ හෙළූ රුහිරෙන්
පසක් කොට, කළුවර සිඳ
නව ලොවක් යදින
මහා ජන ඝෝෂාව...
නුඹ පැතූ ලොවමයි
නුබ ගැබින් එළිය දෙන
අපට අප පෙනෙන
සත්‍යයේ අතීතය
මුසාවෙන් වැසූ මුදුන්වල
නොනැසී පණ ලබයි,
හෙට ලොවට ගෙන එන්න
සත්‍යයම..
අලෝකයම..
යුක්තියම..
යථාර්ථයම..
දිවිදුන්,
දහදිය කඳුළු හෙළූ
විරුවනි,
ඔබ සදා අමරණීයයි..
අප සදා ණයගැතියි..



## මෙගාපික්සල් 3200 ක් ඇති ලෝකයේ විශාලතම ඩිජිටල් කැමරාව



Large Synoptic Survey Telescope (LSST) කැමරාව දළ වශයෙන් කුඩා මෝටර් රථයක ප්‍රමාණයෙන් යුක්ත වන අතර බර ටොන් තුනක් වේ. එය අඩි පහක් පළල ඉදිරිපස කාචයක් සහ ශබ්දය අඩු කිරීම සඳහා සෙල්සියස් අංශක -100 දක්වා සිසිල් කරනු ලබන මෙගාපික්සල් 3,200 සංවේදකයකින් සමන්විත වේ. කැමරාව අවසානයේදී චිලියේ Vera C' Rubin නිරීක්ෂණාගාරයෙහි Simonyi Survey Telescope මත පිහිටුවා ඇති අතර විශාල විවරය, පුළුල් ක්ෂේත්‍ර දෘශ්‍ය කැමරාවට ආසන්න පාරජම්බුල කිරණවලින් ආලෝකය නැරඹීමේ හැකියාව ඇත. අධෝරක්ත කිරණ තරංග ආයාමයට ආසන්න වන අතර ආරෝපණ සම්බන්ධ උපාංග (CCD) සංවේදක 189කින් සමන්විත වේ. මේ වන විට ඉදිකිරීම් අවසන් වෙමින් පවතින දුරේක්ෂය 2024 වසරේදී භාවිතයට ගැනීම ආරම්භ කරනු ඇත.

## ලෝකයේ උසම ගොඩනැගිල්ල බර්ජ් කලීෆා



නවීනතම ගොඩනැගිලි ඉදිකිරීමේ කලාවක් වන Neo- futurism ආකාරයට අනුව ගොඩනැගුනු බර්ජ් කලීෆා (burj khalifa) යනු ලෝකයේ දැනට පවතින උසම ගොඩනැගිල්ලයි. මෙය මීටර 828ක උසකින් යුක්ත වන අතර ඩුබායි එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පිහිටා ඇත. 2010 ජනවාරි 04වැනි දින කුළුණ විධිමත් ලෙස විවෘත කරන ලද අතර, ඒ වන විටත් සියල්ල සම්පූර්ණ වී නොතිබුණි. මෙහි මහල් 162 කින් සහ අඩි 2,717 (මීටර් 828) උසකින් නිම විය. එය නිර්මාණය කර ඇත්තේ චිකාගෝහි වාස්තුවිද්‍යාත්මක සමාගමක් වන ස්කිඩ්මෝර්, ඕවින්ග්ස් සහ මෙරිල් විසිනි. Adrian Smith ගෘහ නිර්මාණ ශිල්පියා ලෙස සේවය කළ අතර, William F' Baker ව්‍යුහාත්මක ඉංජිනේරුවෙකු ලෙස සේවය කළේය.

## කටුසු පවුලේ ලොක්කා කොමඩෝ ඩ්‍රැගන්



කටුසු පවුලේ විශාලතම සත්ව විශේෂය කොමඩෝ ඩ්‍රැගන් නමින් හැඳින්වෙයි. මොවුන් Reptilia කුලයට අයත් වන කොමඩෝ මකරා Varanidae නැමැති පවුලට අයත් සතෙකි. ජීව විද්‍යාත්මකව හඳුන්වන්නේ Varanus komodoensis යන නාමයෙනි. ඔවුන්ගේ ජන්ම භූමිය වනුයේ ඉන්දුනීසියාවයි. අනෙක් කටුසු වර්ග අතුරින් මේ සත්වයා කැපී පෙනෙන්නේ විශාල ශරීරය, පැතලි හිස, වක්‍රාකාර පාද සහ දිගු වලිගය නිසාවෙනි. අඩි 8 -10 පමණ දිගට වැඩෙන කොමඩෝ මකරෙක් කිලෝ ග්‍රෑම් 70 ක් පමණ බරින් යුතු අතර සමස්ත කොමඩෝ මකර ගහණය 6000ක් පමණ වෙයි. වඳවීමේ තර්ජනයට ලක් වී ඇති සත්වයෙකි. ජාත්‍යන්තර ස්වභාව ආරක්ෂණ සංගමයේ රතු දත්ත පොතටද ඇතුලත් වී ඇත. මේ සත්වයා ආරක්ෂිත සත්වයෙකු ලෙස නම්කොට සංරක්ෂණ කටයුතු සිදුකිරීම ආරම්භ කොට තිබේ.

# අධ්‍යාපන ආයතන තුළ පසුගාමිත්වයට එරෙහිවත් අපිට සටනක් තිබෙනවා



**සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා**

***නියමුවා:-*** *නවකවදය ආශ්‍රිතව පැන නැගුණුබව ප්‍රකාශ වන සිදුවීම් ගණනාවක් ගැන සංවාදයක් රට තුළ මතු වී තිබෙනවා. මේ තත්වය ඔබ දකින්නේ කොහොමද?*

***රංගන දේවප්‍රිය සහෝදරයා:-*** උසස් අධ්‍යාපන ආයතනවල නවකවදය පිළිබඳ සිදුවීම් කාලයෙන් කාලයට විවිධ ස්වරූපයෙන් මතුවෙනවා අපිට දකින්න පුළුවන්. නවකවදය පිළිබඳ සිදුවීම් පදනම් කරගත් වාර්තා සමහර ඒවා සත්‍ය සිදුවීම් පදනම් කරගෙන ගොඩනගුණු ඒවා වන අතර, අර්ධ සත්‍ය සහ අතිශයෝක්තියෙන් ගොඩනගපු සිදුවීම්ද තිබෙනවා. ඇතැම් අසත්‍ය සිදුවීම්ද මේ තුළ වාර්තා වෙනවා. මේ කුමන ආකාරයේ වාර්තාවක් වුවත් ගොඩනගන්න හැකියාව ලැබී තිබෙන්නේ නවකවදයක් තවමත් විශ්වවිද්‍යාලවල පවතින නිසා. මෙම සිදුවීම් විශ්විවිද්‍යාල තුළ ගොඩනැගෙන්නේ හුදකලාවම නොවෙයි. මේ තුළ ලාංකේය සමාජ තත්වයන්ගේ දායකත්වයක් තිබෙනවා.

**විශ්වවිද්‍යාල සිසුන් විදිහට පසුගාමී තත්වයන් වෙනස් කරගෙන අලුතින් උකහා ගත් දේවල් සමග ඒවාට හැඩ ගැසෙන ආකාරයට අලුත් සංස්කෘතීන් ගොඩනගා ගැනීමට සමත් විය යුතුයි. එවිට ඉවත් කළ යුතු පසුගාමී තත්වයන් ඉවත් කර දැමීමට හැකිවෙනවා. මේ කරුණ ගැන සලකා බලද්දීත් නවකවදය කියන කරුණට අපි විරුද්ධයි.**

මේකට මූලික වශයෙන් පදනම් වූ හේතු කිහිපයක් තිබෙනවා. එයින් ප්‍රධානම හේතුව වන්නේ සමාජය තුළ පවතින පසුගාමිත්වය. අපේ රටේ බොහෝ දෙනෙක් සුපර්ස්ටාර් වෙන්න කැමතියි. තරු වෙන්න කැමතියි. ඒ කියන්නේ අනික් අයට වඩා තමන් ප්‍රමුඛයෙක් වීමට ඇති කැමැත්ත. අනෙක් අතට අපේ රටේ ඉතිහාසයේ පටන් ගොඩනැගුණු ප්‍රභූ වන්දනාවට අදාළ පසුගාමී මානසිකත්වයක් තිබෙනවා. ප්‍රභූ වන්දනාව තුළ තිබෙන දෙයක් තමයි, කිසියම් බලයක් සහිත, මුදල් හෝ වෙනත් තත්වයන් මගින් සමාජය තුළ මතුවී පෙනෙන අය ඉදිරියේ වැඳවැටෙන එක. අතීතයේ නම් ප්‍රභූවරයෙක් එනවිට කාණුවට බැසීම වැනි ප්‍රභූවරුන්ට සැලකිලි දක්වන, කොන්ද නමන ස්වරූපයක් අපේ සමාජය තුළ තිබෙනවා. ඒ නිසාම සමහරුන් සමාජය තුළ 'පොරවල්'වීමේ, කැපීපෙනීමේ කැමැත්තක් දක්නට ලැබෙනවා.

ඒ වගේම පංති සමාජය විසින් ගොඩනගපු ආත්ම ලාභය මත පදනම්ව කටයුතු කිරීම මේ සමාජය තුළ දකින්නට ලැබෙනවා. අනෙකාව පීඩාවට පත්කර හෝ තමන්ගේ අරමුණ දිනාගැනීමට උත්සාහ කරනවා. අනෙකාට අත්වන පීඩාව තමන්ට අදාළ නැහැ. ආත්මාර්ථකාමී මානසිකත්වයන් මේ සමාජය තුළ තිබෙනවා. ඒ සියල්ලේ ප්‍රතිඵලයක් විදිහට සමාජය ඉදිරියේ තමන්ට මතුවී පෙනෙන්නට ඉඩක් ලැබුණහම ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන අරගෙන අනුන්ව පීඩාවට පත්කරන්න පටන් ගන්නවා. ආධුනිකයන් ඉදිරියේ තමන්ගේ බලය, හැකියාව විදහා පාන එක, ඉහළ තලවල ඉන්න අය පහළ අයව පීඩාවට පත්කිරීම, විවිධ රැකියා ස්ථාන තුළ, ගම්වල, ප්‍රාදේශීයව විවිධ ආකාරයෙන් අපට මේ තත්වය දකින්නට ලැබෙනවා. නවකවදයත් එවැනි ආකාරයට වර්ධනය වුණු එකක්. විශ්වවිද්‍යාල තුළ පෙර පැමිණි ඇතැම් ශිෂ්‍යයන් ආධුනික සිසුන් ඉදිරියේතමන් උසස් යැයි හැඟෙන ආකාරයට කටයුතු කරමින් ආධුනිකයන් පීඩාවට පත්කරන්න ඔවුන් පැමිණි මුල් කාලය අවස්ථාවක් කර ගන්නවා. මෙය සමාජයේ ඇති පසුගාමී ලක්ෂණයන් විසින් උද්ගත කරන දෙයක් විදිහට තමයි අපි මෙය දකින්නේ. ඒ වගේම තමන්ට සමාජය තුළකැපීපෙන්න අවස්ථාවක් නොලැබීයාමතුළින් හා අසමානතාවය තුළින් මතුවූ පීඩාව ඒ ඔස්සේ පිටකරගන්න උත්සාහ කරන බව තමයි මේ නවකවදය තුළින් අපට පෙනෙන්නේ.

***නියමුවා:-*** *සරසවි සම්ප්‍රදායක් වූ තිබූ නවකවදයට එරෙහිව සමාජවාදී ශිෂ්‍ය සංගමය දිගු කාලයක් පුරා මතවාදී අරගලයක් ගෙනගියා. මේ ගැන සඳහන් කළොත්...*

***රංගන දේවප්‍රිය සහෝදරයා:-*** සමාජවාදී ශිෂ්‍ය සංගමය විදිහට අපි විශ්වාස කරන්නේ සමානාත්මතාව පවතින සාධාරණ සමාජයක් ගොඩනගන්න ඕනි කියන මතය. අපි කාලයක් තිස්සේ අරගල කරමින් ඉන්නේ එවැනි සමාජයක් දිනාගන්න.
ඒ වගේම අපි විශ්වාස කරනවා එම සමාජය දිනා ගැනීමට හැකිවෙන්නේ කිසිදු බේදයකින් තොරව සාමූහිකව කරන අරගලයකින් කියලා. කුමන ආකාරයක හෝ බෙදීමක් වෙන්වීමක් තව කෙනෙක් පීඩාවට පත්කිරීමක් අපි පිළිගන්නේ නැහැ. වෙන ආකාරයකින් ප්‍රකාශ කළොත් ජාතිවාදය, කුලවාදය, ආගම්වාදය හෝ කෙනෙකු අනෙකාට උසස් විදිහට සැලකෙන හා අනෙකාව පහත් කොට සැලකෙන කිසිවක් සමාජවාදී ශිෂ්‍ය සංගමය විදිහට අපි පිළිගන්නේ නැහැ. විශ්වවිද්‍යාලය තුළත් කෙනෙක් අනෙකාට යටත් විය යුතු නැති, පීඩාවට පත් විය යුතු නැති පරිසරයක් තිබිය යුතු බව අපි විශ්වාස කරනවා.

අනෙක් පැත්තෙන් විශ්වවිද්‍යාලවල පැවතිය යුතු නිදහස වෙනුවෙන් අපි පෙනී සිටිනවා. විශ්වවිද්‍යාලය තුළට දේශපාලන මැදිහත්වීමෙන් හා අධ්‍යාපන ක්‍රමවේදය තුළ ශිෂ්‍යයන්ට තිබෙන නිදහස අහිමි කිරීමෙන් සිදුකරන පීඩාවන් තිබෙනවා. ඒ පීඩාවන් පුපුරා යාමෙන් සිදුවන බේදවාචක අපි දකිනවා. විශ්වවිද්‍යාලය කියන්නේ නිදහසේ අධ්‍යාපනය ගවේෂණය කරන්න පුළුවන් තැනක් විය යුතුයි. තමන් අධ්‍යාපනය ලබන විෂයයන් පමණක් නොවෙයි. විශ්වවිද්‍යාලය ලෝකෙ තියෙන දැනුම, අධ්‍යාපනය ලබාගන්න ඉඩකඩ තිබෙන තැනක් විය යුතුයි. ඒ තුළ තිබෙන නිදහසට බාධාකරන්න බලධාරින්ටවත් කිසිදු ශිෂ්‍යයෙකුටවත් අයිතියක්, හැකියාවක් නැහැ. නවකවදය වැනි සිදුවීම් මගින් වෙන්නේ එවැනි බාධාවන් මතුවෙන එකයි. මේ වෙනකොට ශිෂ්‍යයෝ ඉන්නේ අධ්‍යාපනයෙන් දැවැන්ත පීඩාවට පත්වෙලා. අද තිබෙන අධ්‍යාපන රටාව තුළ පොතට කොටුකරන ලද අධ්‍යාපනයක් තමයි තිබෙන්නේ. මේ තුළ විවිධ බේදවාචකයන් නිර්මාණය වෙලා තිබෙනවා. සිසුන් සිය දිවි නසාගන්න තත්වයට පත්වෙලා තිබෙනවා. මෙසේ පීඩාවට පත්වෙලා ඉන්න ශිෂ්‍යයන්ව තවදුරටත් පීඩාවට පත්කරන්නේ කොහොමද? එසේ පීඩාවට පත්කිරීමට කාටවත් අයිතියක් තියෙනවද? ඒ නිසා කළ යුත්තේ තවදුරටත් පීඩාවට පත්කරනවා වෙනුවට පීඩාවට පත් සිසුවා ඉන් නිදහස් කිරීමේ පරිසරයක් ගොඩනගන එකයි.

මේ අනුව අපිට පේන දෙයක් තමයි නවකවදය වැනි පසුගාමී ක්‍රියා දියුණු සමාජය, ප්‍රගතිශීලී අදහස් වෙනුවෙන් පෙනී සිටින මිනිසුන්ට කරන්න හැකියාවක් නැහැ. මේ අදහස තුළ අපි නවකවදය ප්‍රතික්ෂේප කරනවා. සංවිධානයක් විදිහට අපි විශ්වාස කරන්නක් තමයි සමාජයේ ඇති පසුගාමීභාවය එසේ නැත්නම් වැරදි යල් පැනගිය සංස්කෘතික ලක්ෂණ, ඉතිහාසයේ අභාවයට යැවිය යුතු දේවල් තවදුරටත් සමාජය විසින් පවත්වාගෙන යනවා නම් එය සමාජයේ ඉදිරිගමනට කරන බාධාවක්. ඒ හරහා ජයග්‍රහණයන් දිනා ගැනීමට නොහැකි වටපිටාවක් සමාජය තුළ නිර්මාණය වෙනවා. විශ්වවිද්‍යාල සිසුන් විදිහට පසුගාමී තත්වයන් වෙනස් කරගෙන අලුතින් උකහා ගත් දේවල් සමග ඒවාට හැඩ ගැසෙන ආකාරයට අලුත් සංස්කෘතීන් ගොඩනගා ගැනීමට සමත් විය යුතුයි. ඉවත් කළ යුතු පසුගාමී තත්වයන් ඉවත් කර දැමීමට මැදිහත් විය යුතුයි.

සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ආරම්භයේ පටන්ම මේ සම්බන්ධයෙන් නිවැරදි කියවීමක් අපිට තිබුණා. විශේෂයෙන් 90 දශකයේ මැද භාගයේ පටන්, දැවැන්ත මර්දනයකින් පසු විවෘතව තලයේ වැඩ කළ හැකි තත්වයන් යටතේ මේ සම්බන්ධයෙන් විවිධාකාරයේ ක්‍රියාමාර්ගයන් අපි ගත්තා. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ පුවත්පත් වැනි ප්‍රකාශන තුළ, මේ සම්බන්ධයෙන් මතවාදී තලයේ සංවාදයක් ගෙනගියා. ඒ වගේම 'තෙල් බැම්මෙන් ඔබ්බට' වගේ වෙනම කෘති පවා මුද්‍රණය කර මෙම කරුණු සම්බන්ධයෙන් අපේ ස්ථාවරයන්, විග්‍රහයන් ඉදිරිපත් කරන්න කටයුතු කළා. එළියෙදී අදහස් පැහැදිලි කිරීම්වල, සම්මන්ත්‍රණවලදී, මාධ්‍ය හමුවලදී, මතවාදීව අදහස් ඉදිරිපත් කරන්න කටයුතු කර තිබෙනවා. විශ්වවිද්‍යාල තුළ ශිෂ්‍යයන් අතර කරන සාකච්ඡාවලදී, මතවාදී අරගලවලදී සමාජවාදී ශිෂ්‍ය සංගමය මෙම ස්ථාවරය වෙනුවෙන් පෙනී සිටියා. මතවාදීව සිදුකරන මැදිහත්වීම්වලට පමණක් සීමා නොවී අපි මෙය ප්‍රායෝගික ක්‍රියාකාරිත්ව තලයට පවා ගෙනවිත් තිබෙනවා. ශිෂ්‍යයන් නවකවදයට ලක්වෙන අවස්ථා වළක්වාලීම වෙනුවෙන්, ශිෂ්‍යයන් අතර සාමූහිකත්වය ගොඩනගන, පොදු සංවාද ගොඩනගන ක්‍රියාකාරකම්, අලුත් සංස්කෘතිකාංග විශ්වවිද්‍යාලය තුළට හඳුන්වා දීමටත් ක්‍රීඩා, කලා සංස්කෘතික අංග මගින් සාමූහිකත්වය ගොඩනැගීමටත් අපි මැදිහත් වී ඉන්නවා.

***නියමුවා:-*** *නවකවදය මගින් ශිෂ්‍ය ව්‍යාපාරය මත ඇති කරන අනතුර සමාජවාදී ශිෂ්‍ය සංගමය ලෙස විග්‍රහකරගන්නේ කවරාකාරයකටද?*

***රංගන දේවප්‍රිය සහෝදරයා:-*** නවකවදය නිසා ශිෂ්‍ය ව්‍යාපාරය පැති දෙකකින් අනතුරකට මුහුණ පා සිටිනවා. ඉන් පළවෙනි එක මේ මගින් ශිෂ්‍ය ව්‍යාපාරය අභ්‍යන්තර වශයෙන් දුර්වල වෙනවා. සමහරු කරන ප්‍රකාශයක් තමයි නවකවදය නිසා සාමූහිකත්ව ක්‍රියාකාරිත්වයක් ඒ මත ගොඩනැගෙනවා යන මතය. ඇත්ත වශයෙන්ම සිදුවී තිබෙන්නේ නවකවදය නිසා ශිෂ්‍ය ව්‍යාපාරය බෙදීමකට ලක්වීමයි. නවකවදයට ලක්වෙන සහ නොවෙන අය ලෙස සමහර අවස්ථාවල ගැටුම් පවා සිදු වී තිබෙනවා. හැබැයි නවකවදය නැති විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන් අතර සාමූහිකත්වය ගොඩනැගෙන නොයෙකුත් දැවැන්ත ක්‍රියාකාරකම්, විෂය පරිබාහිර ක්‍රියාකාරකම්, සමාජය සමග එකතු වී කරන වැඩසටහන්, කලා උළෙලවල්, ක්‍රීඩා උළෙලවල්, ප්‍රදර්ශන දකින්නට ලැබෙනවා. අද නවකවදය සාමූහිකත්වය විනාශ කරන එකක් බවට පත්වෙලා. ඒ වගේම තවත් තිබෙන මිථ්‍යා මතයක් තමයි එයින් පොදු වැඩ වෙනුවෙන් ශිෂ්‍යයෝ යොමු කරන්න නවකවදය නිසා හැකියාව ලැබෙනවා කියන මතය. අනිකා ගැන හිතන්න පුරුදු වෙලා තිබෙන්නේ නවකවදය නිසා යන්න. වෛද්‍ය ශිෂ්‍ය ව්‍යාපාරය මෑත කාලයේ සයිටම් එකට විරුද්ධව දැවැන්ත සටනක් ගෙනගියා. වසරකට ආසන්න කාලයක් වෛද්‍ය ශිෂ්‍යයෝ පංති වර්ජනය කරලා සියයට සියයක්ම වර්ජනයට සහයෝගය දුන්නා. එම වෛද්‍ය පීඨවල නවකවදයක් තිබුණේ නැහැ. ඒ නිසා පොදු හැඟීම හදන්න නවකවදයක් අවශ්‍ය නැහැ. ඒ වෙනුවට නවකවදය නිසා ශිෂ්‍ය ව්‍යාපාරය භේදවීම ශිෂ්‍ය ව්‍යාපාරයට අභ්‍යන්තරික අනතුරක් විදිහට තිබෙනවා.

අනෙක් පැත්තෙන් මේ නවකවදය නිසාම ආණ්ඩුවට පුළුවන්කම ලැබිලා තිබෙනවා විවිධ අණපනත් ගෙනැවිත් ශිෂ්‍ය ව්‍යාපාරය මර්දනය සඳහා මැදිහත්වීමට හේතු හදාගන්න. 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවකවදය සහ වෙනත් ස්වරූපයේ හිංසන ක්‍රියා තහනම් කිරීමේ පනත ගෙනාවා. මේ පනත ගේන්න පාදක කරගෙන තිබෙන්නේ නවකවදය කියන කාරණාව. මේ පනත අනුව පෙර වසරවල ශිෂ්‍යයෙකුට නවක ශිෂ්‍යයෙක් සමග කතා කරන්න බැහැ. ශිෂ්‍යයෙක් සමග කතා කිරීම, ආචාර්යවරයෙක් සමග කතා කිරීම ප්‍රශ්න කරන්න පුළුවන්. වෙනත් ක්‍රියාකාරකම් ප්‍රශ්න කිරීමට පුළුවන්. ඒවාට නීතියෙන් දඬුවම් කිරීමට පවා පුළුවන්. නවකවදය සීමා කිරීම වෙනුවට ඒ මුවාවෙන් ශිෂ්‍ය ව්‍යාපාර මර්දනය කිරීම තමයි සිදුවෙලා තිබෙන්නේ. මේ නවකවදය වැනි සිදුවීම් පාවිච්චි කර සතුරු පාර්ශ්වයන්ට ශිෂ්‍ය ව්‍යාපාරයට පහර දෙන්න ඉඩකඩ නිර්මාණය කර තිබෙනවා.

පසුගිය දිනවල පේරාදෙණිය විශ්විවිද්‍යාලය පදනම් කරගෙන සිදු වූ ගැටුමට සම්බන්ද බවට චෝදනා එල්ලකරන පිරිස අතරට ශිෂ්‍ය සංගම් නායකයින් පවා ඇතුළත් කර තිබෙනවා. ඉන් සමහරු එදා දවස තුළ විශ්වවිද්‍යාලය තුළ හෝ අදාළ දිස්ත්‍රික්කය තුළ වත් සිට නැහැ. එහෙමයි නවකවද සිදුවීම් පදනම් කරගෙන ශිෂ්‍ය

11 වැනි පිටුවට

# අගමැතිවරුන් මාරු කරමින් විසඳුම් සොයන බ්‍රිතාන්‍යය




වසරක් තුළදී තුන්වන අගමැතිවරයාවද තෝරා ගැනීමට බ්‍රිතාන්‍යයට සිදුවිය. නව අගමැතිවරයා බවට පත්වූයේ ඉන්දියානු සම්භවයක් සහිත බ්‍රිතාන්‍ය ජාතික ධන කුවේරයෙක් වන රිෂී සුනැක්ය. ඔහු බ්‍රිතාන්‍යයේ කොන්සවේටිව් පක්ෂයේ නායකයා ලෙස තෝරා පත් කර ගනු ලැබුවේ ඔහුට පෙර අග්‍රාමාත්‍ය ධූරය දැරූ ලිස් ට්‍රස් දින 45ක් තරම් කෙටි කාලයකදී සිය අග්‍රාමාත්‍ය ධූරයෙන් ඉල්ලා අස් වීමෙන් ඇති වූ පුරප්පාඩුව සඳහාය.

## කෙටිම පාලනය

නව අගමැතිවරිය ලෙස තේරී පත්වීමෙන් පසු ලීස් ට්‍රස් ප්‍රකාශ කළේ ඇය බ්‍රිතාන්‍ය ආර්ථිකය යළි බලගන්වා දිගුකාලීන සාර්ථකත්වයේ මඟට ගෙන එන බවය. එහෙත් ඇය ඉදිරිපත් කළ කෙටි කාලීන අයවැයෙන් හඳුන්වා දුන් බදු කපා හැරීමේ සහ ණය ගැනීමේ සැලසුම් විසින් බැංකුකරුවන්, වෙළඳපොළ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කැළඹීමට පත් කරන ලදී. මුදල් ඇමතිවරයා ධූරයෙන් ඉවත් කර දැමූවද ඇයගේ පාලනය පිළිබඳ මතු වූ අවිශ්වාසය නැවත ප්‍රකෘතිමත් කර ගැනීමට ඇයට හැකි වූයේ නැත.

ලිස් ට්‍රස් ගේ පාලන කාලය බ්‍රිතාන්‍ය ඉතිහාසයෙහි කෙටිම පාලනය ලෙස වාර්තා වේ. 2010 වසරේ සිට පවතින බ්‍රිතාන්‍ය කොන්සර්වේටිව් පක්ෂ පාලන කාලය තුළ මේ දක්වා අග්‍රාමාත්‍යවරුන් හත්දෙනකු පත්කර ගනු ලැබ තිබිණි. ඉන් ප්‍රකාශයට පත් වන්නේ කොන්සවේටිව් පක්ෂය තුළ පවතින අභ්‍යන්තර ගැටුමින් එහා ගිය, බ්‍රිතාන්‍ය තුළ වර්ධනය වී ඇති දේශපාලන අර්බුදයේ ගැඹුරය. අනෙක් අතට බ්‍රිතාන්‍යය තුළ මතු වී ඇති දේශපාලන අර්බුදය විසින් ප්‍රශ්න කෙරෙන්නේ එරට දේශපාලනය පමණක්ම නොවේ. දිනෙන් දින ජනප්‍රියත්වයෙන් හා නීත්‍යානුකූලභාවයෙන් ගිලිහෙන බටහිර යුරෝපීය දේශපාලන ක්‍රමයද ඉන් ප්‍රශ්න කෙරෙමින් තිබේ.

## නව අගමැතිට පාර කැපීම

රිෂී සුනැක්ගේ ආණ්ඩුව වසර 12ක කොන්සර්වේටිව් පක්ෂ පාලන කාලය තුළදී ගොඩනඟන ලද අටවෙනි ආණ්ඩුවයි. බ්‍රිතාන්‍ය මාධ්‍ය එරට තුළ මතුවී ඇති මෙකී දේශපාලන අස්ථාවරභාවය ඉතාලිය තුළ මතු වී ඇති දේශපාලන අස්ථාවරභාවයට සමාන කරමින් විග්‍රහ කරන අතර The Economist සඟරාව බ්‍රිතාන්‍යය හඳුන්වනු ලැබූයේ 'බ්‍රිටැලී' යන නමිනි. දැන් බ්‍රිතාන්‍යය මුහුණ දී ඇති අර්බුදය හමුවේ රට පාලනය කිරීමේ අභියෝගය රිෂී සුනැක් වෙත පැවරී තිබේ. දේශපාලන විචාරකයන්ට අනුව ඒ සඳහා ඔහු තෝරා ගනු ලැබුවේ ඔහු සතු කිසියම් විශේෂිත හැකියාවක් හේතුවෙන් නොව ඉදිරියේ ඇතිවන දේශපාලන කුණාටුව විසින් තමන්ගේ දේශපාලන අනාගතය අවසන් කරතැයි යන බියෙන් අනෙකුත් අපේක්ෂකයන් කොන්සර්වේටිව් පක්ෂ නායකත්වය සඳහා තරඟ නොවැදීම නිසාවෙනි.

රිෂී සුනැක් ප්‍රථම වරට පාර්ලිමේන්තුවට තේරී පත් වන්නේ 2015 වසරේදීය. (ඔහු ජයග්‍රහණය කළ අසූන වසර සියයකට වැඩි කාලයක් පුරා කන්සර්වටිව් පක්ෂය අපරාජිතව ඇති ආසනයකි) ඔහු ඊට පෙර ගෝල්ඩ්මන් සැක්ස් ආයතනයේ බැංකුකරුවකු ලෙස සේවය කළේය. 2019-2020 සමයේ භාණ්ඩාගාර ලේකම්වරයා ලෙස කටයුතු කළ ඔහු 2020 - 22 අතරදී බ්‍රිතාන්‍යයේ මුදල් අමාත්‍යවරයා ලෙස කටයුතු කළේය. ඔහු බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ සිටින ධනවත්ම පුද්ගලයා ලෙසද සැලකේ. එපමණක් නොව ඔහු පසුගිය කොවිඩ් වසංගතය කාලයේ කොවිඩ් නීති උල්ලංඝනය කිරීම පිළිබඳවද බරපතළ ලෙස බදු මුදල් වංචා කළ අයෙකු ලෙසද චෝදනා ලැබ සිටින අයෙකි.

ලෝක ආර්ථික අර්බුදය හමුවේ බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වන්නේ ඉන් (ආර්ථික අර්බුදයෙන්) ගැලවීමේ මඟක් ලෙසටය. එතැන් සිට බ්‍රිතාන්‍යය පාලනය කළ කන්සර්වේටිව් පක්ෂය බ්‍රිතාන්‍යයේ පැරණි අධිරාජ්‍යයේ සශ්‍රීකත්වයට නැවත ළඟා වීමේ අරමුණින් කටයුතු කරන්නට විය. ජාත්‍යන්තර දේශපාලනයේදී එක්සත් ජනපදය අනුව යමින් චීනය හා රුසියාවට එරෙහිව කටයුතු කරමින් එක්සත් ජනපදය සමග විවිධ යුදමය සන්ධානයන් ගොඩනගමින් කටයුතු කරන්නට විය. එහෙත් එය බ්‍රිතාන්‍යය තුළ මතු වී ඇති ආර්ථික අර්බුදයට පිළියම් සැපයීමට අසමත් වී ඇති බව පෙනේ. නිල වාර්තාවලට අනුව බ්‍රිතාන්‍යයේ මිලියන 32 ක ජනතාවකට සිය ජල බිල් පත් විදුලි බිල්පත් ඇතුළු ගාස්තු ගෙවාගත නොහැකිය. ඉන්ධන හා ආහාර මිල ගණන් දිනපතා ඉහළ යමින් පවතී. මේ නිසා ආහාර බැංකුවල ලියාපදිංචි වන බ්‍රිතාන්‍ය වැසියන්ගේ ගණන දිනපතා ඉහළ යමින් පවතී. උද්ධමනය සියයට 10 ඉක්මවා ඉහළ ගොස් තිබේ. රුසියානු-යුක්රේන යුද්ධය විසින් මතුකර ඇති තත්වයන් මත මෙකී ගැටලු තවදුරටත් වර්ධනය වනවා මිස විසඳෙන ලකුණු පෙනෙන්නට නැත.

## නව ජනවරමක් ඉල්ලීම

විපක්ෂය වන බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂය පවසන්නේ දැන් කොන්සවේටිව් පක්ෂයේ ජනවරම අහෝසි වී ඇති බවය. ඔවුන් බලකර සිටින්නේ වහාම මහ මැතිවරණයක් පවත්වා රටට නව ජනවරමක් ලබා දෙන ලෙසටය. එහෙත් ව්‍යවස්ථාමය වශයෙන් බ්‍රිතාන්‍යයේ මීළඟ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට නියමිතව ඇත්තේ 2024 වසරේ දෙසැම්බර් මාසය සහ 2025 වසරේ ජනවාරි මාසය අතරතුරදීය. මේ තත්වය තුළ නව අගමැතිවරයාටද සිදුවන්නේ ජනතාව මත බදු බර පටවමින් සහ සූරාකෑම තවදුරටත් තීව්‍ර කිරීමට අවශ්‍ය තත්වයන් සකසා දීම මගින් ආර්ථික අර්බුදයට පිළියම් සෙවීමටය.

මේ අතර බ්‍රිතාන්‍ය තුළ වැඩිවන බඩු මිලට එරෙහිවත් ඉහළ යන ජීවන වියදමට සරිලන ලෙස වැටුප් වැඩි වීමක් ලබා දෙන ලෙසත් ඉල්ලමින් රාජ්‍ය හා පෞද්ගලික අංශ සේවකයන්ගේ වෘත්තීය අරගල ඉදිරියට පැමිණෙමින් තිබෙන අතර බ්‍රිතාන්‍ය ධනවාදය පවතින අර්බුදය විසඳීමට තමන් අසමත් බව පෙන්වමින් තිබේ.

මේ සියලු තත්වයන් සලකා බලමින් බොහෝ විචාරකයන් ප්‍රකාශ කර සිටින්නේ, නව අගමැතිවරයාටද වර්ධනය වෙමින් පවතින ආර්ථික අර්බුදය නිසි ලෙස කළමනාකරණය කර ගැනීමට ඇති ඉඩකඩ අඩු බවය; ඔහුටද අසාර්ථක අගමැතිවරයෙකු ලෙස වේදිකාවෙන් බැසයාමට සිදු වනු ඇති බවය.

## චීනය: කොමියුනිස්ට් පක්ෂය 20වැනි සමුළුව පවත්වා



චීන කොමිනිස්ට් පක්ෂයේ විසිවැනි සමුළුව ඔක්තෝබර් 16වැනි දින බීජිං නුවරදී ආරම්භ විය. සමුළුවේ තේමාව වූයේ, "චීන ලක්ෂණ සහිත සමාජවාදයේ ශ්‍රේෂ්ඨ ධජය ඔසවාගෙන, නව යුගයක් සඳහා චීන ලක්ෂණ සහිත සමාජවාදය පිළිබඳ චින්තනය මුළුමනින්ම ක්‍රියාවට නගමින්, පක්ෂය බිහි කිරීමේ ශ්‍රේෂ්ඨ අරමුණ ඉදිරියට ගෙනයමින්, විශ්වාසය තහවුරු කරගනිමින්, ශක්තිය ගොඩනඟමින්, මූලික ප්‍රතිපත්ති රකිමින් සහ නව මංපෙත් හෙළි පෙහෙළි කරගනිමින් සෑම අතින්ම නවීන සමාජවාදී රටක් ගොඩනැගීම සහ චීන ජාතියේ මහා ප්‍රබෝධය සෑම අතින්ම ඉදිරියට ගෙන යාමට සමගියෙන් වෙර දැරීම"ය.

මෙම සමුළුවට නියෝජිතයින් 2340ක් සහභාගි වූ අතර ඉන් 2379ක් තෝරා පත් කරගන්නා ලද අය වෙති. ඉතිරි 83 දෙනා විශේෂ ආරාධිතයෝ වූහ.

මෙම සමුළුවේදී පසුගිය සමුළුවේ සිට ගතවූ වසර පහ පිළිබඳ ඇගයීමක් කිරීමටත් ඉදිරි වසර පහ සඳහා සැලසුම් සකස් කිරීමටත් ඉදිරි කාලය සඳහා නව නායකත්ව මණ්ඩලයක් තෝරා පත්කර ගැනුණු අතර වත්මන් ජනාධිපතිවරයාද වන ප්‍රධාන ලේකම් ෂීජින්පිං තෙවන වරටත් ප්‍රධාන ලේකම් ධූරය සඳහා තෝරා ගනු ලැබිණි.

## ප්‍රංශය: බලශක්ති කම්කරුවෝ ප්‍රංශය අඩපණ කර




ප්‍රංශ බලශක්ති ක්ෂේත්‍රයේ කම්කරුවන් විසින් ආරම්භ කරන ලද වැඩවර්ජනයක් හේතුවෙන් රට තුළ දැවැන්ත අර්බුදයක් මතු වී තිබේ. ප්‍රංශයේ Total Energy පිරිපහදු සේවකයින් හා ඉන්ධන බෙදාහැරීමේ සේවකයින් වැටුප් වැඩිවීමක් ඉල්ලා ආරම්භ කළ වැඩවර්ජනයට මාසයක කාලයක් ගත වී තිබුණි. ඒ අනුව යමින් ප්‍රංශයේ Esso-Exxon Mobile පිරිපහදු සේවකයෝද ප්‍රංශ න්‍යෂ්ටික විදුලි බලාගාර සේවකයෝද සාධාරණ වැටුපක් ඉල්ලා වැඩවර්ජනයක් ආරම්භ කළහ.

බලශක්ති ක්ෂේත්‍රයේ මෙම වෘත්තීය ක්‍රියාමාර්ගයට සහාය පළකරමින් ප්‍රංශයේ පොදු කම්කරු සම්මේලනය වැඩ වර්ජනයක් හා රට පුරා නගරවල විරෝධතා ව්‍යාපාරයක් සංවිධානය කළේය. මෙම විරෝධතා වලට රට පුරා ලක්ෂයකට වැඩි පිරිසක් සහභාගි වූහ.

## රුසියාව: යුක්රේනයෙන් පළාත් ඈඳා ගනිමින්




රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් පසුගිය සැප්තැම්බර් 30වැනි දින යුක්රේනයේ පළාත් හතරක් නිල වශයෙන් රුසියාවට ඈඳා ගත් බව ප්‍රකාශ කළේය. මෙලෙස ඈඳා ගනු ලැබුවේ නැගෙනහිර යුක්රේනයේ කේසොන් (Kherson) සැපොරිෂ්ෂියා (Zaporozhzhiya) ලුහාන්ස්ක් (Luhansk) සහ ඩොනෙක්ස් (Donetsk) යන පළාත්ය. මෙම ඈඳා ගැනීම දෙවන ලෝක යුද්ධයෙන් පසු සිදුකරන ලද විශාලතම ඈඳා ගැනීම ලෙස සැලකේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ලේකම් ඇන්ටෝනියෝ ගුටරෙස් ඊට ප්‍රතිචාර දක්වමින් පැවසුවේ තමන් එම ඈඳා ගැනීම හෙළා දකින බවත් ඊට කිසිදු නීතිමය වටිනාකමක් නොමැති බවත්ය.

## ලෝකය: ආර්ථික අර්බුදයක ගිලෙන බවට පුරෝකථනය වී




ලෝක ආර්ථිකය 'ආර්ථික අවපාතයක්' කරා අනතුරුදායක ලෙස ගමන් කරමින් සිටින බවට ලෝක බැංකු අධිපති ඩේවිඩ් මල්පාස් ඔක්තෝබර් 13වැනිදා එහි වාර්ෂික හමුවේදී ප්‍රකාශ කර සිටියේය. ඒ අනුව 2023 වර්ෂය සඳහා ගෝලීය ආර්ථික වර්ධන වේගය සියයට තුනේ සිට සියයට 1.9 දක්වා අඩු කිරීමට සිදුවන බවත් උද්ධමනය, පොලී අනුපාතික ඉහළ යාම හා සංවර්ධනය වෙමින් පවතින රටවල් කරා ප්‍රාග්ධනය ගලා නොයෑම විසින් දුප්පතුන් බරපතළ ලෙස පීඩාවට පත්ව සිටින බවත් ඔහු එහිදී තවදුරටත් පෙන්වා දුන්නේය.

# ලෙඩා මලත් බඩ සුද්ධයි ආර්ථිකය!

## 2023 අයවැයට පෙරවදනක්

ආණ්ඩුවේ 2023 අයවැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. නමුත් අයවැයේදී ඉදිරිපත් කරන ආදායම් යෝජනා බොහොමයක් මේ දිනවල ජංගම දුරකථන කෙටි පණිවුඩ (SMS) මගින් මේ දිනවල ඉදිරිපත් වනු දැකිය හැකිය. 15% කින් වැට් බදු වැඩි කිරීම, සමාජ ආරක්ෂණ බදු ඉහළ දැමීම, ආදායම් බදු අය කිරීම රුපියල් ලක්ෂයක ආදායමට අදාළ කර ඔක්තෝබර් මස සිට අයකිරීම, කැසිනෝ ගාස්තු බද්ද 150%කින් වැඩි කිරීම, නිවාස වහළවල සවිකළ සූර්යබල පද්ධති සඳහා වූ බදු අනුපාත සාමාන්‍ය විදුලි බිලට ගැලපීම ආදිය මින් කිහිපයක් පමණි.

ආර්ථික විද්‍යාව පිළිබඳ සාමාන්‍ය දැනීම සහිත දරුවෙකු පවා දන්නා කාරණයක් වන්නේ, ආර්ථිකයක එක් විචල්‍යයක් ඉලක්ක කර සිදුකරන වෙනස්කමක් එම විචල්‍යයට පමණක් නොව මුළුමහත් ආර්ථිකයේ සියලු විචල්‍යයන්ට බලපාන බවය. නැතහොත් ආර්ථික විද්‍යාත්මකව පැහැදිලි කරන්නේ සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ වෙනස්කම් නොසලකා ක්ෂුද්‍ර විචල්‍යයන්ගේ වෙනස්කම් කළ නොහැකි බවයි.


සරල උදාහරණයකින් කියන්නේ නම්, ඩොලර් ණයට ගෙන නෙළුම් කුලුන හැදූ විට අපට නෙළුම් කුලුනක් ඇතැයි අභිමානයෙන් සතුටු විය හැකිය. නමුත් ඒ ණයවල බලපෑම වක්‍ර බදු ගෙවන යාචකයන්ටද අදාළ වීම වැළැක්විය නොහැකි වනු ඇත. ගතවුණු අවුරුදු 74න් වැඩිම වාර ගණනක් ආණ්ඩු කරන ලද පාලකයින් ගෙන ඇති තීරණ බොහොමයක් ඒවා 'ලෙඩා මලත් බඩ සුද්දයි' වර්ගයේ තීරණ බව දැන් ප්‍රායෝගික අත්විඳීම්වලින් ජනතාව තේරුම් ගනිමින් සිටිනු දැකිය හැකිය.

### බදු තීරණය

ආණ්ඩුව ඉතාම මෑතකදී ඇස් පියාගෙන ගනු ලබූ තීරණයක් වන්නේ ආදායම බදු සීමා වැඩි කිරීමේ තීරණයයි. එයින් මුළු මහත් ආර්ථිකයේ විචල්‍යයන්ට වන බලපෑම ආණ්ඩුව තක්සේරු නොකළද ජනතාව ලෙස සෑම කෙනෙකුම තේරුම් ගත යුතුව තිබේ.

ආණ්ඩුවක් තම කටයුතු කරගෙන යාමට ආදායම ලබාගන්නා ප්‍රධානම මාර්ගය බදු බවට විවාදයක් නැත. නමුත් බදු අයකළ හැක්කේ බදු අය කිරීමේ මූලික සැලැස්ම ආරක්ෂා කරමින්ය. ආණ්ඩුවේ 'එදා වේල' ගැන පමණක් නොසිතා රටේ වත්මන් අනාගත සියලු පැවැත්ම පිළිබඳව සිතිය යුතුය. පනවන ඕනෑම බද්දක් සාධාරණ විය යුතුය. එය සරල විය යුතුය. අයකර ගත හැකි විය යුතුය. ආණ්ඩුව මේ සරල මූලික සිද්ධාන්ත රැකගෙන කිසිදාක බදු පනවා නැත. සුපිරි මන්දිර බදු, මන්දිර බදු, කැසිනෝ බදු, එක්වරක් පමණක් අයකළ බදු (සුපර් ගේන් ටැක්ස්) වැනි බදු අයවැය මගින් යෝජනා කළද අයකර ගැනීමට වැඩපිළිවෙළක් තිබී නැත. ඒ නිසා එවැනි බදු පැනවීම ගජමිතුරන්ට අවාසියක් ගෙනදෙන්නේ නැත. ඔවුන් බදු පැනවීමටද, නොගෙවා සිටීමටද බිය වන්නේ නැත.

ආණ්ඩුව බදු කපා හරින විට ඉන් උපරිම වාසි ලබාගන්නේ සාමාන්‍ය ජනයා නොව බදු ගෙවිය යුතු එහෙත් නොගෙවා පැහැර හරින බදු හොරුන්ය. 2019 ජනාධිපතිවරණය ජයග්‍රහණය කළ විගස ගෝඨාභය උපයන විට ගෙවීමේ බද්ද, රඳවා ගැනීමේ බද්ද ඇතුළු බදු ගණනාවක් ඉවත් කළේය.




එයින් ආණ්ඩුවට වාර්ෂිකව ලැබෙන ආදායමෙන් බාගයක්ම අහිමි විය. එයින් සමස්ත ආර්ථිකයට සිදුවූ බලපෑම දරාගැනීමට සිදු වූයේ බඩු මිල, ඉන්ධන මිල, ගෑස් මිල ආදිය ඉහළ දැමීම ඔස්සේ මුළු මහත් ජනතාවටය. ආණ්ඩුවේ වියදම දරාගත නොහැකි නිසා පසුගියදා මාසයකට රුපියල් ලක්ෂ 3 වැටුප් ඉපයූවන් ගෙවිය යුතුව තිබූ ආදායම් බදු සීමාව, මාසයකට ලක්ෂයකට වැඩිය උපයන කෙනාද ඇතුළත් වන පරිදි වෙනස් කරන ලදී. ඒ අනුව කෙනෙක් බදු ගෙවීමට අදාළ නොවන බොහෝ දෙනෙක් බදු ගෙවීමට ලක්කිරීම ආණ්ඩුවේ වුවමනාව බව පැහැදිලිය.

ආණ්ඩුව බදු පරාසය මෙන්ම බදු අයකිරීම් අනුපාතයන්ද වෙනස් කළේය. වැටුප් වැඩිවීමට ගැලපෙන ලෙස බදු අනුපාතයද වැඩි කළේය. ඒ අනුව වෙනදා රුපියල් 25,000ක් බදු ගෙවිය යුතුව තිබූ තැනැත්තා දැන් රුපියල් ලක්ෂයකට වඩා බදු ගෙවිය යුතු වන්නේය.

ආණ්ඩුව මෙහිදී සලකා ඇත්තේ එක් කරුණක් ගැන පමණි. එනම්, ආණ්ඩුවේ ආදායම අඩු නිසා වැඩි පඩි ඇති අයට වැඩි බදු පනවා ආණ්ඩුවේ ආදායම ඉහළ දමා ගැනීමය. ආදායම යන සාධකය ගැන පමණක් සලකන විට, එය ආර්ථිකයට, ජන ජීවිතයට බලපාන්නේ කෙසේද? වැඩි පඩි ලබන අයෙක් ලෙස වෛද්‍යවරයෙකු, මහාචාර්යවරයෙකු සැලකුවහොත්, ඔහු රුපියල් ලක්ෂයක් වැටුප් ලබන අයෙකුට වඩා ලක්ෂ 4-5ක් ආදායම ලබන අයෙකු විය හැකිය. ඒ නිසාම ඔහුගේ ජීවන රටාවද ඔහු සකස් කරගෙන ඇත්තේ ඔහුගේ ආදායම අනුවය. ඒ නිසා ඔහුගේ ආදායම් මට්ටමේ වාහනයක් ඔහු මිලදී ගෙන තාමත් වාරික ගෙවනවා විය හැකිය. ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයට වියදම් කිරීම ඔවුන් තීරණය කර ඇත්තේ ආදායමට අනුවය. සමහර විට පෞද්ගලික අධ්‍යාපනය හෝ උසස් අධ්‍යාපන ආයතනයක ලංකාවේ හෝ පිටරට ඉගෙන ගන්නවා විය හැකිය. වියපත් දෙමව්පියන් නඩත්තු කිරීම, පෞද්ගලික ව්‍යාපාර හෝ මූල්‍ය සමාගමක ආයෝජනය කිරීමට ඔහුගේ වැටුප් ආදායමින් කොටසක් වෙන්කර තිබිය හැකිය. ලක්ෂයක් වැටුප් ලබන කෙනෙකුගේ ජීවන රටාව ලක්ෂයේ වැටුපට සරිලන ලෙස සකස් කරගෙන ඇති සේම ලක්ෂ 3ක් හෝ 5ක් වැටුප් ආදායම උපයන තැනැත්තන්ද වැටුපට ගැලපෙන ජීවන රටාවක් සකස් කරගෙන තිබෙනු ඇත. ඔහු ලක්ෂ 5ක් වැටුප් උපයා ඇත්තේ කැපකළ ශ්‍රමයේ වටිනාකම ලෙසය. ඔහු ඉගැන්වීමට, හැදෑරීමට කැපකළ ශ්‍රමයට ඔහු අද ලබන ජීවන වැටුප ආණ්ඩුවේ හදිසි අර්බුදයට ගෙවීමට සූදානම් විය යුත්තේ ඇයි? විශේෂයෙන් නාස්තිකාර ආණ්ඩුවකට ඔහු ගෙවිය යුතු වන්නේ ඇයි?

අනෙක් වැදගත් කරුණ වන්නේ, ආණ්ඩුව බදු වැඩි කරන සැණින් බදු දැලට අසුවන තැනැත්තන්ට ඇති විකල්ප අවස්ථා පිළිබඳව ආණ්ඩුව දක්වා ඇති අඩු සැලකිල්ලයි. ලංකාවේ ලක්ෂ 05ක ආදායමක් ඇති ශල්‍යවෛද්‍යවරයාට විදේශ රටකට ගොස් ඊට වැඩි වැටුපකට රැකියාවක් කිරීමේ හැකියාව තිබියදී ඔහු ලැබිය හැකි ඉහළ වැටුප කැපකර රට වෙනුවෙන් හෝ පෞද්ගලික අවශ්‍යතාවක් නිසා ලංකාවේ රැඳී සිටී නම් සහ ඔහුගේ ඔහු ලබන වැටුප ගැන පමණක් සලකා ලක්ෂ 1 1/2ක පමණ බද්දක් ආණ්ඩුවට අයකරගත හැකිද?

### ආදායම විචල්‍ය සහ රැකියා අර්බුදය

ආණ්ඩුව සලකා ඇත්තේ ආණ්ඩුවේ ආදායම ගැන පමණි. ජනතාවට ආණ්ඩුවට ගෙවනවාට වඩා සිතීමට බොහෝ කාරණා ඇත. බැරි කෙනාට සිතන්නටද බැරිය. නමුත් අවස්ථා ඇති අය විකල්ප ගැන සිතන්නේය. ඒ නිසා මැදි ආදායම උපයන රැකියා කරන බොහෝ දෙනා රැකියාවලින් ඉවත්වී ලංකාව හැරයාම අරඹා ඇත. ඒ අතර, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, පරිගණක මෘදුකාංග කර්මාන්තයේ නියැලෙන්නන්, ඉංජිනේරුවන්, වෛද්‍යවරුන් වැනි වෘත්තිකයන් ප්‍රධානය. ලංකාවේ ප්‍රධාන සමාගම්වල ඉහළ හා මධ්‍යම කළමනාකරුවන්ගේත් රැකියා කරන බොහෝ දෙනාගේ සිට විශ්වවිද්‍යාලවල හා උසස් අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන ශිෂ්‍ය ප්‍රජාවන්ගේත් අභිලාෂය කෙසේ හෝ රටින් පැනයාම වී ඇත්තේ මේ නිසාය.

දැනටමත් අත්‍යවශ්‍ය නිෂ්පාදන ක්ෂේත්‍රයේ ශ්‍රම බලකා හිඟයක්ව ඇති තත්වය යටතේ අනාගත රැකියා වෙළඳපොළ දැඩි අර්බුදයකට පත්වීම වැළැක්විය නොහැකිය. ආර්ථික අර්බුදය නිසා ආයතනවල රැකියා නියුක්තිකයන්ට වැටුප් ගෙවීම අර්බුදයක් වීම නිසා ඉවත් කිරීමට සිදුවී ඇති තත්වයට අමතරව රැකියාවල සිටිය යුතු වෘත්තිකයන් රට හැරයාම දැන් ආණ්ඩුවේ තකතීරු තීරණවල ප්‍රතිඵලය වී තිබේ.

### මුදල් අච්චු ගැසීමේ විචල්‍යය


පැවති රාජපක්ෂ පාලනයේ 'කබ්රාල් තියරිය' අනුව මහ බැංකුවට අවශ්‍ය තරම් මුදල් අච්චු ගැසීමේ තීරණයද මෙවැනිම සර්ව ආර්ථික විචල්‍යයන් නොසලකා ගනු ලැබූ දේශපාලන තීරණයකි. එහි ප්‍රතිඵලය වූයේද අසීමිත ලෙස බඩු මිල ඉහළ යාම නිසා දරාගත නොහැකි ජීවන බරකට මුළු මහත් සමාජයම යට කිරීමයි.

ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර මගින් ආණ්ඩුව ණය ගෙන කලින් ගත් ණය ගෙවීමට වැඩි පොලියට යෙදවීමේදී එම ණය බර පීඩනය දැරීමට සිදුවූයේ ජනතාවටය. ජනතාවට අද තම පරිභෝජන රටාව හෙට වෙනුවෙන් කැපකර ආණ්ඩුවේ ණය ගෙවීමට සිදුවී ඇත.

ලංකාවේ බැංකු පද්ධතිය අද අනතුරට පත්ව ඇත්තේද ආණ්ඩුව ගනු ලැබූ මෙවැනිම පටු තීරණ නිසාය. බැංකු තම මුදල් ආයෝජනය කිරීමේ පහසුම මාර්ගය ලෙස දැන් භාවිත කරන්නේ ආණ්ඩුවට ණය දීමය. එයට හේතුව ආණ්ඩුවේ දෛනික වැටුප් ගෙවීම වැනි වියදම් පියවා ගැනීමට ඉහළ පොලියට බැංකුවලින්, භාණ්ඩාගාර බිල්පත් මගින් ණය ගැනීමයි. එවිට ආණ්ඩුව තමන්ගේ ප්‍රශ්නය විසඳා ගනී. නමුත් කර්මාන්ත, ව්‍යාපාර නිෂ්පාදන අංශවලට බැංකුවලින් ණය ගෙවීම් හැකියාව මුළුමනින්ම ඇහිරේ. 30% පොලියට ණය ගෙන 10% - 18% ලාභ සහිත ව්‍යාපාර කිරීමට කිසිවෙකු පෙළඹෙන්නේ නැත. එපමණක් නොවේ, මෙතෙක් අඩු පොලියට ණය ගෙන ව්‍යාපාර, කර්මාන්ත, නිෂ්පාදන සිදුකළ ව්‍යාපාරිකයන්ට දැන් තව ඉහළ පොලී ගෙවීමට සිදුව ඇත්තේ අනෙකුත් වියදම් ඉහළ ගිය ආදායම් අහිමි කරනු ලැබූ වටපිටාවකය.

ණය ගෙන හැදූ නෙළුම් කුලුන නරඹා, බදු ගෙවා බඩගින්නේ ගත කරන ජීවිත වෙනස් කිරීමට පාලකයන් අසමත් බව දැන් ඔප්පු කර හමාරය. සාර්ව ආර්ථික විචල්‍යයන් වෙනුවට 'ලෙඩා මලත් බඩ සුද්දයි' න්‍යායේ ආර්ථික තීරණ ගනිමින් ඔවුන් ඔප්පු කරමින් සිටින්නේ කඩා වැටෙන ධනේශ්වර ක්‍රමය රැකීමට පාලක පංතියේ ඇති නොහැකියාවය. දැන් ජනතාවද මේ දෛනික ආර්ථික සිදුවීම්වල යටිපෙළ හොඳින් හැදෑරිය යුත්තේ මේ දූෂිත පාලකයන්ට අනුගතවීමට නොව එම පාලනය වෙනස් කර, නව ජනතාවාදී පාලනයක් පිහිටුවීමටය.

> ආණ්ඩුව සලකා ඇත්තේ ආණ්ඩුවේ ආදායම ගැන පමණි. ජනතාවට ආණ්ඩුවට ගෙවනවාට වඩා සිතීමට බොහෝ කාරණා ඇත. බැරි කෙනාට සිතන්නටද බැරිය. නමුත් අවස්ථා ඇති අය විකල්ප ගැන සිතන්නේය. ඒ නිසා මැදි ආදායම උපයන රැකියා කරන බොහෝ දෙනා රැකියාවලින් ඉවත්වී ලංකාව හැරයාම අරඹා ඇත.



"ජීවිතයට ප්‍රශ්න එන්නේ ඔබ විනාශකිරීමට නොවේ. ඔබ තුළ සැඟවුණු ශක්තීන් සොයා ගැනීමට ඔබට උදව් කිරීමටය."

**අබ්දුල් කලාම්**



# කුටුම්භයෙන් ඔබ්බට

"චාන්දනී මිස්ගෙ බෙල්ලට පිහියක් තියලා මාලෙ කඩාගෙන"

මෙවැනි කතා අද බොහෝ තැන්වලින් අසන්නට ලැබේ. මේ, රටේ පවතින ආර්ථික අර්බුදයේ අතුරු ප්‍රතිඵලයකි. ආර්ථික අර්බුදය විසින් ඇති කරන ලද සමාජ ප්‍රශ්න ගණනාවක් මේ වන විට පැන නැගී තිබේ. ඒ ඔබට, මට නිතර දෙවේලේ අසන්නට දකින්නට සහ අත්විඳින්නට සිදුවෙන ප්‍රශ්න ගණනාවකි.

දැන් කාර්යාලයට යන කාන්තාවන් රනින් සැරසී මගට බසින්නේ නැත. ඒ වෙනුවට ප්ලාස්ටික් හෝ ගල්වලින් නිමවූ හෝ ඇට මාලයක්, කරාබු දෙකක් පළඳිති. නැත්නම් ආභරණ කිසිවක් නොපැළඳ ගමන් ගනිති. ගැලවූ රන් ආභරණ නිවසේ තබා යාමටද නොහැකිය. ඒ, දැන් රාත්‍රියේ පමණක් නොව මහා දවාලෙත් ගෙවල්වලට හොරු පනින නිසාවෙනි. බොහෝ ගෙවල්වල ඇත්තටම රන් භාණ්ඩ නැත. ආර්ථික ගැටලු හමුවේ ඒවා උගස් කරනු ලැබ ඇත. වෙනදා ලස්සනට ඇඳ පැළඳ මගට බට කාන්තාවන් දැන් පාරට බහින්නේ වෙනදා නැති තරම් සැකයෙන් සහ බියෙනි. ඒ, කොයි මොහොතේ හෝ මංකොල්ලකරුවෙකු විසින් තම පසුම්බිය, දුරකථනය හෝ බඩු මල්ල පැහැර ගනීවි දැයි දෙගිඩියාවෙනි.

එසේම කාන්තාවන්ට වෙනදා තරම් කලඑළියට අඳින්නට පුළුවන් කමක් නැත. ඒ, ඇඳුම් පැලඳුම්වල මිල ඉතා ඉහළ බැවිනි. රජයේ කාර්යාලයක සේවය කරන කාන්තාවන්ට සාරි ඇඳීමට සිදුවේ. සාරියක මිල රුපියල් 5000/- වඩා වැඩිය. සාරියට හැට්ට මැසීමට තවත් රුපියල් 2000ක් පමණ වැයවේ. විශේෂයෙන් මේ ප්‍රශ්නයේදී දැඩි ලෙස පීඩාවට පත්වන්නේ පාසල් ගුරුවරියන්ය. අත්බෑගයක් රුපියල් හාර පන්දාහකි. රුපියල් හාරපන්සීයට තිබූ කුඩයක් දැන් 1500/කට වඩා වැඩිය. මෙවැනි තත්වයක් තුළ 'ඇඳීම' පීඩාවකි. මානසික වදයකි.

කාන්තාවන් ලෙස හැඩට ලස්සනට ඉන්නට කවුරුත් කැමතිය. එනිසාම අපේ රටේ වයස් භේදයකින් තොරව කාන්තාවෝ කවුරුත් රූපලාවන්‍ය කටයුතු කෙරෙහි වැඩි කැමැත්තක් දක්වති. නමුත් වර්තමානය වන විට රූපලාවන්‍ය ද්‍රව්‍ය ඉතා මිල අධිකය. සැලෝන්වලද ගාස්තු ඉහළ ගොසිනි. අඩුම වියදමට තිබූ ඇහිබැම සකස් කිරීමට පවා අය කෙරෙන්නේ ඉහළ මිලකි. එනිසා වෙනදා පාවිච්චි කළ සබන්, පවුඩර්, cream, ෂැම්පු, සුවඳ විලවුන් පාවිච්චි කිරීම අද කරන්නට නොහැකිය. කාන්තාවන්ට ඒ අවශ්‍යතා මුදල් නොමැතිකම නිසා මගහරින්නට සිදුව තිබේ.

බරපතළම අර්බුදය පැනනගින්නේ සනීපරක්ෂක තුවා සම්බන්ධයෙනි. සනීපාරක්ෂක තුවා මිල ඉහළ යෑම නිසා බොහෝ පාසල් දැරියන් ඔසප් දිනවල පාසල් පැමිණීමේ අඩුවක් දක්නට ලැබුණි. එනිසාම දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලටද අනෙකුත් කාන්තාවන්ගේ සමාජමය කටයුතුවලටද බලපෑම් එල්ලවේ. එය එක් අතකින් කාන්තාවන්ගේ මානසික සහනයට බලපෑම් එල්ල කරනු ලබන කාරණාවකි. මෙය ආර්ථික අර්බුදයේ නොපෙනෙන සැඟවුණු කතාවකි. අනෙක් පැත්තෙන් සම්භාහන ආයතන යන බෝඩ් ලෑලිවලට ආවරණය වී සිදුකරනු ලබන ගණිකා ව්‍යාපාරයේ සීඝ්‍ර වර්ධනයක් ඇති වී ඇත.

ළමා රක්ෂණ අධිකාරියේ තොරතුරුවලට අනුව පසුගිය මාස 8ට ළමා හිංසන පැමිණිලි 7500ක් ලැබී තිබේ. ඒ වාර්තා වන ප්‍රමාණය මිස සත්‍ය ප්‍රමාණය නොවේ. හෙළිදරව් නොවන ළමා හිංසන තවත් බොහෝ ප්‍රමාණයක් අප රට තුළ සිදුවෙන බව අපි හොඳාකාරවම දනිමු. අනෙක් අතින් අධ්‍යාපනය සඳහා වන වියහියදම්වල ඉහළ යාම නිසා අධ්‍යාපනයෙන් පිටමං වන දරුවන් ප්‍රමාණය වැඩිවී ඇති බවක් දකින්නට තිබේ. විශේෂයෙන්ම මේ තත්වය මත ඉතා අඩු වයසින් රැකියාවක් සොයා ගැනීමට පෙළඹෙන දරුවන්ද ඉතා අඩු වයසින් විවාහ වීමට පෙළඹෙන දැරියන්ද දක්නට ලැබේ.

ආර්ථික අර්බුදය හමුවේ ආහාර සපයා ගැනීමට නොහැකි දරුවන් පාසල් දිවා ආහාරය සඳහා මැල්ලුම් සහ බත්ද, ලූණු මිරිසක් සමග බත්ද, පොල් මදද ආහාරයට ගෙනා පුවත් අපි දුටුවෙමු. එසේම කිසිවක් ආහාරයට නොගෙනෙන දරුවන් ප්‍රමාණයද ඉතා ඉහළය. ආහාර සපයා ගැනීමට නොහැකි නිසාද බොහෝ දරුවෝ පිරිසක් වර්තමානය වන විට පාසල් අධ්‍යාපනය නවතා දමා සිටිති.

මේ සියලු කාරණා මත සෘජුව හෝ වක්‍රව වැඩි වශයෙන් පීඩාවට පත් වන්නේ කාන්තාවන්ය. මව්වරුන් ලෙසද බිරින්දෑවරුන් ලෙසද වැඩකරන කාන්තාවන් ලෙසද තරුණියන් ලෙසද කුඩා දැරියන් ලෙසද නොයෙක් ආකාරයෙන් මේ සමාජ ප්‍රශ්න හමුවේ ඇය පීඩාවට පත්වේ.

මේ අපේ සමාජයේ අද දවසේ දක්නට ලැබෙන බරපතළ සමාජ ඛේදවාචකයන්ය. මේ ප්‍රමාණය දිනෙන් දින වර්ධනය වෙනවා මිස මේවාට නිසි විසඳුම් මේ පාලකයන්ගෙන් බලාපොරොත්තු විය නොහැකිය. දිනෙන් දින උග්‍ර වන ආර්ථික අර්බුදය හමුවේ මෙවැනි සමාජ ප්‍රශ්න තවදුරටත් ඔඩුදුවනවා විනා විසඳුමක් නැත. එවැනි තත්වයක් තුළ හෙට දවසේ මගට බසින්නට හෝ නිවෙස් තුළ ඉන්නට හෝ බැරි වෙන තත්වයක් ගොඩනැගුණු හොත් එයද පුදුමයට කාරණයක් නොවේ.

මේ සියලු ප්‍රශ්නවලට විසඳුම ඇත්තේ මේ දුෂ්ට මජර දේශපාලන ක්‍රමය මුලිනුපුටා දැමීමෙන් මිස විවිධ සුබ සාධන වැඩසටහන් මඟින් තාවකාලික පැලැස්තර ඇලවීමෙන් නොවේ. ඒ සඳහා මේ පීඩාවට පත් ජනතාව සූදානම් කරවීම අද දවසේ අපේ කාර්යභාරයයි. විශේෂයෙන් මේ අර්බුදය හමුවේ නැවත නැවත පීඩාවට පත්වෙන කාන්තාවන් මේ පීඩාවෙන් මිදෙන මග වෙත යොමු කිරීම අද දවසේ අපිට පැවරී ඇති සුවිශාල කාර්යභාරයකි. එසේ නොවුණහොත් හෙට දින මහමග ඇස්පනාපිට දූෂණය වෙන දැරියන්ද මහමග මරා දැමෙන කාන්තාවන්ද වැඩි වශයෙන් දක්නට ලැබෙනු ඇත. මානසික පීඩාවන්ගෙන් හෙම්බත් වුණු කාන්තාවන් තම ජීවිතය නැති කර ගන්නටද පෙළඹෙන දවස වැඩි ඈතක නොවේ. එය අද දවසේ යම් ප්‍රමාණයකට සිදුවෙමින් පවතී. එසේ නම් මේ සියලු ගැටලුවලට මුල කොතනදැයි අප විසින් සමාජයට අවබෝධ කරවිය යුතුවේ. ඒ සඳහා කරුමය හෝ උරුමය යන පටු ආකල්ප හෝ මිථ්‍යාව මත පදනම්ව තීන්දු තීරණ නොගෙන දේශපාලන සවිඥානයෙන් පවතින තත්වයන් අවබෝධ කරගැනීම සඳහා කාන්තවාන් ඥානනය කිරීම අද දවසේ අපේ අත්හළ නොහැකි කාර්යභාරය වනු ඇත.



## මේ, සමාජය වෙනස් කිරීමේ තීරණාත්මක මොහොතයි

**වත්සලා කොඩිකාර සහෝදරිය**
හම්බන්තොට දිස්ත්‍රික් සංවිධායක
අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය

ගැහැනිය, පුරවැසියෙක් හා වගකිව යුතු ඡන්ද දායිකාවක් ලෙස අද අපිට දැනෙනවා. අපි කවුරුත් එකතු වෙලා කළ යුතු සමාජමය, දේශපාලනමය වෙනසක් තියෙනවා. මොකද අද රට වට්ටලා තියෙන තැන නිසා ඇතිවෙලා තියෙන ආර්ථික පරිහානිය තුළ කුස්සියේ ප්‍රශ්න ටික විතරක් නොවෙයි ඊට අමතරව ගැහැනියගේ හදවතේ මිරිකිලා තියෙන දහසක් සමාජ ප්‍රශ්න ගොන්නකුත් තියෙනවා. පරිස්සම් කරගන්න වෙලා තියෙන්නේ ඇගේ ශරීරය පමණක් නොමෙයි; කරාබු දෙක, කරේ බඳින මාලේ, අතේ ගෙනියන පර්ස් එක ඇතුළු සියල්ලක්ම බලහත්කාරයෙන් උදුරාගෙන යන මහ පුදුම සමාජයක්, පීඩනය තුළ ගොඩනැගී තිබෙනවා. අද අපි ඇවිල්ල තියෙන්නේ හිංසාව, අසතුට, පීඩනය පමණක් ඉතිරි කර ඇති මෙම සමාජය වෙනස් කිරීමේ තීරණාත්මක මොහොතකටයි.



## බලාපොරොත්තුව

හතර අත උතුරෙ හා ... දකුණු
සැනසුමෙන් හැඩ නොවුණ ... මුහුණු
පිපිරුණත් ඉඳහිටක ... අකුණු
ගැහැනු හිත්වල තිබුණෙ වැහිබර ... ලකුණු

හැමදාම උරණ වී ... අකුරු
අකාලෙට මිලින මල් ... පොකුරු
පෙති තලයි නපුරු කළු ... දෙබරු
කහට උගුරකට මොනවටද ... හකුරු?

බඩසයින් හඬන කිරි ... කැදුළු
විසිරිලා දෑත බැඳි ... පබළු
ඉහිරුණත් මුව'ග රැඳි ... මුකුළු
ඉඩෝරෙට මියෙන්නෑ සමහරක් ... ළපලු

හිම පියලි දැවිය හැකි ... සුසුම්
හදවතේ කුමට හිර ... කරම්
ගිනි කඳුත් නිවිය හැකි ... තරම්
සැකක් නෑ නුදුරේම සුපිපේවි ... කුසුම්





## ඉරානයේ අරගල රැල්ල තවදුරටත් ඉදිරියට

මාසා අමිනි නම් 22 හැවිරිදි තරුණිය ඉරානයේ සදාචාර පොලිසියේ භාරයේ සිටියදී රෝහල්ගත කිරීමෙන් අනතුරුව ජීවිතක්ෂයට පත්වීම සමග ඉරානයේ ඇති වූ ආණ්ඩු විරෝධී අරගල රැල්ල තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී. තරුණ තරුණියන් විසින් ආරම්භ කළ මෙම අරගලයට මේ වන විට සමාජයේ බොහෝ ස්ථරවල සහය හිමිවී ඇති අතර බොහෝ දෙනා සදාචාර පොලිසිය අහෝසි කිරිම පමණක් නොව අයතුල්ලා අල් කුමේනි එනම් එරට අධ්‍යාත්මික නායකයාගේ ඉවත්වීම හා ඉස්ලාමීය ජනරජයේ වෙනසකටද බල කරනු දක්නට ලැබේ. ව්‍යාපාරික ප්‍රජාව සහ වෘත්තීය සමිති මෙම අරගලයට සක්‍රීය දායකත්වය සපයයි. ඉරාන පාලනාධිකාරිය විසින් ගෙනයන ප්‍රචණ්ඩකාරී මර්දනය හමුවේ ඔක්තෝම්බර් මස මැද භාගය වන විට මියගිය සංඛ්‍යාව 200කට ආසන්න වූ අතර ඒ අතරින් 24 දෙනෙක් ළමෝ වූහ. තවත් දහස් ගණනක පිරිසක් තුවාල ලබා සිටින අතර දහස් ගණනක පිරිසක් සිරගත කරනු ලැබ සිටිති. වීදි සටන්වලට සම්බන්ධ වූ බොහෝ කාන්තාවන් සහ තරුණියන් විසින් සිය හිජාබයන් ප්‍රසිද්ධියේ ගිනි තැබීම සහ හිසකෙස් කැපීම ආදිය මගින් විරෝධතාව ප්‍රකාශ කරන ලදී. මෙවන් විරෝධතාවයකට සහභාගි වූ 16 හැවිරිදි නිකා ශකාරමී ආරක්ෂක අංශ විසින් පලවා හැරීමෙන් පසු අතුරුදහන්වීමත් දින 10කට පසුව ඇයගේ සිරුර මෘත ශරීරාගාරයකින් හමුවීමත් සමග විරෝධතා ව්‍යාපාරය තවදුරටත් වර්ධනය විය. ඉරාන ජනතාවගේ මෙම අරගලයට බොහෝ රටවල ජනතාවගේ සහයෝග ලැබෙමින් පවතින අතර බොහෝ රටවල සමගාමී විරෝධතා දක්නට ලැබේ.

## ඇෆ්ගනිස්ථානයේ කාන්තා විරෝධතා

පසුගිය සැප්තැම්බර් 30 වනදා ඇෆ්ගනිස්ථානයේ කාබුල්හි විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාල අධ්‍යාපන ආයතනයකට එල්ල වූ මරාගෙන මැරෙන ප්‍රහාරයකින් 53 කට ආසන්න පිරිසක් මරණයට පත් වූ අතර තවත් 110 කට ආසන්න පිරිසක් තුවාල ලබන ලදි. මේ අතරින් බොහෝ දෙනෙක් කාන්තාවෝ වූහ. මෙය එරට හසාරා නැමති සුළු ජාතික ජන ප්‍රජාව ඉලක්ක කර සිදුකරන ලද ප්‍රහාරයක් වූ අතර ISIS-K යන ත්‍රස්තවාදී කණ්ඩායම මෙම ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ප්‍රහාර එල්ල කරමින් සිටී. මෙම ප්‍රහාරයට විරෝධතාවය ප්‍රකාශ කරමින් මෙන්ම ගැහැනු ළමුන්ට පාසල් වසා දැමීම සහ විවිධ හේතු මවමින් ශිෂ්‍යාවන් විශ්වවිද්‍යාල සහ නේවාසිකාගාරවලින් පිටමන් කිරීමට එරෙහිව කාන්තාවෝ වීදි බැස උද්ඝෝෂණවල නිරත වූහ. එරට තලේබාන් පාලනය විරෝධතාකරුවන් මර්දනය කරනු ලැබුවේ ඔවුන්ට පහරදීම්, බැණවැදීම්, ජංගම දුරකතන කුඩුකිරීම සහ බලහත්කාරී ලෙස විසිරුවා හැරීම මගිනි. තලේබාන් පාලනය ආරම්භ වූ තැන පටන් කාන්තාවන්ගේ අයිතිවාසිකම් විශේෂයෙන් අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිවාසිකම සහ රැකියාවල නිරත වීමට ඇති අයිතිවාසිකම් වේගයෙන් කප්පාදු කරන ලදී. මෑතකදීම නිකුත් කළ වාර්තාවකට අනුව ද්විතියික පාසල් අවධියේ පසුවන ගැහැනු දරුවෝ මිලියන 1.1 පමණ පාසල් නොයති. මර්දනය හමුවේ වුවද ඇෆ්ගනිස්ථානය පුරා විවිධ නගරවල කාන්තාවෝ සිය අධ්‍යාපන අයිතිය වෙනුවෙන් විරෝධතාවන්හි නිරත වෙති.

# ඉතිහාසයේ එකම දෙය යළිත් ?



"මිනිසුන් තමන් හා අවට පරිසරය මැඩගෙන මෙතෙක් නොවූ විරූ යමක් නිර්මාණය කිරීමට මෙසේ ඉදිරිපත් වන මොහොතේදී, මෙන්න මෙවැනි විප්ලවීය අර්බුද සහිත යුගවලදී, අතීතයේ මළගිය ආත්ම තමන්ගේ ආධාර පිණිස අඬගැසීමේ මන්ත්‍ර බියසුළු ලෙස ජපකරමින්, පැරණි වෙස්මුහුණු බැඳගෙන, පැරණි ණයට ගත් බසින් කතා කරමින්, සමස්ත ලෝක ඉතිහාසයේ නව ජවනිකාවක් රඟපෑම සඳහා, ඔවුන්ගේ නම්ද, යුද්ධමය සටන් පාඨද, ඇඳුම්ද ලබා ගනිති"

**කාල් මාක්ස්**

**ලුයී බොනපාට්ගේ බෲමර් දහ අටවැනිදා ලිපිය**

**මාක්ස් - එංගල්ස් තෝරාගත් කෘති, 01වැනි වෙළුම - පිටුව 128**

ලුයී බොනපාට්ගේ 'බෲමර් දහඅටවැනිදා' නමැති සිය සුප්‍රසිද්ධ ලිපිය ආරම්භයේ කාල්මාක්ස් මෙසේ සඳහන් කර තිබේ. "ලෝක ඉතිහාසයේ ඉතා වැදගත් සිද්ධීන් හා පෞරුෂත්වයන් දෙවරක් ඇතිවන බව කිව හැකියි" යැයි හෙගල් වරක් පැවසීය. එහෙත් ඔහුට මෙලෙස එකතු කිරීමට අමතක විය; ඒවා ඇතිවන්නේ ප්‍රථමවර ඛේදජනකයක් ලෙසත් දෙවැනිවර හාස්‍යජනකයක් ලෙසිනි. ඩැන්ටන් වෙනුවට කොසිඩියේද, රොබස්පියර් වෙනුවට ලුයී බ්ලාන්ද, 1793 - 1795 මොන්ටේනය වෙනුවට 1818 - 1851 මොන්ටේනයද, මාමා වෙනුවට බෑනාද වශයෙනි."

එවකට පැවති ප්‍රංශයේ දේශපාලන අර්බුදය පිළිබඳ විග්‍රහ කිරීමට මාක්ස් ඉදිරිපත් කළ මෙම අදහස සමහර වෙනස්කම් සහිතව වුවත් වර්තමානයේ ලංකාවටද ගැලපෙන බවක් පෙනේ.

## මාමා වෙනුවට බෑනා

ලංකා ඉතිහාසයේ ප්‍රජාතාන්ත්‍ර විරෝධීම ධනපති පාලකයා වූයේ ජේ.ආර්. ජයවර්ධනය. නිතර ප්‍රජාතන්ත්‍රවාදය මැතිරූ ඔහු 'ප්‍රජාතන්ත්‍රවාදයේ' නාමයෙන් මැතිවරණ කල් දැමීය. ඒ 1983 පැවැත්විය යුතු පාර්ලිමේන්තු මහ මැතිවරණය නොපවත්වා ප්‍රෝඩාකාරී ජනමත විචාරණයකින් ඔහු සතුව තිබුණු හයෙන් පහේ බලයක් සහිත පාර්ලිමේන්තුව තවත් වසර 6කට කල්දමා ගැනීමෙනි. එය අපේ රටේ ඉතිහාසයේ ඛේදවාචකයක් නිර්මාණය කිරීමට ද හේතු විය.

දැන් වර්තමානයේ ලංකාවේ බලයේ සිටින්නේ ජයවර්ධනගේ බෑනා වන රනිල් වික්‍රමසිංහය. ඔහුද දැන් මාමා ගිය අඩිපාරේ යාමට සූදානම් වන බව පෙනේ. ඒ 2023 මාර්තුවලට පෙර පැවැත්විය යුතු පළාත් පාලන මැතිවරණය කල්දමා ගැනීමට උප්පරවැට්ටි සකසමිනි. ලංකාවේ පළාත් පාලන මැතිවරණය නියමිත පරිදි පැවැත්විය යුතුව තිබුණේ 2022 මාර්තුවලය. එතෙක් රට තුළ පැවති දැවැන්ත ආණ්ඩු විරෝධය හා විශේෂයෙන් රාජපක්ෂ විරෝධය නිසා ඡන්දය තැබීමට බියවූ රාජපක්ෂ පාලනය පළාත් පාලන ඇමතිවරයාට ලැබී ඇති බලතල උපයෝගී කරගෙන පළාත් පාලන ආයතනවල නිල කාලය වසරකින් දිගුකර ගත්තේය. දැන් ව්‍යවස්ථාවට හා පළාත් පාලන පනතට අනුවත් ඡන්දය යළි කල්දැමීමට පවතින නීතියෙන් ඉඩක් නැත. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා දැන් අලුත් උප්පරවැට්ටියක් යොදා ඡන්දය කල්දැමීමට උත්සාහ කරන්නේ මෙම තත්වය තුළ මාමාගේ අඩිපාරේ යාමට උත්සාහ කරමිනි.



## ප්‍රජාතන්ත්‍රවාදයට බියවීම

රට දැවැන්ත සමාජ ආර්ථික දේශපාලන අර්බුදයකට ඇදදමා ඇති රාජපක්ෂලා හා රනිල් වික්‍රමසිංහලා දැන් ඔවුන් නිතර මතුරන ඔවුන්ගේම ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයට පවා බියවී සිටිති; දේශපාලන සදාචාරයට අනුව බලනවිට, ගෝඨාභයට ජනාධිපති ධුරය අත්හැරීමට බලකරන තරමේ ජනතා විරෝධයක් රාජපක්ෂ පාලනයට එරෙහිව එල්ල වූ නිසා දැන් තවදුරටත් බලයේ සිටීමට රාජපක්ෂ පාලනයට අයිතියක් නැත. එහෙත් ඔවුන් රටේ ජනමතය නොසලකා පර්ලිමේන්තුවේ බලය උපයෝගී කරගෙන බලයේ සිටිති. එය ප්‍රජාතන්ත්‍ර විරෝධීය.

එසේම රනිල් වික්‍රමසිංහ ජනාධිපති ධුරයට පත් වූයේද ජනතාවගේ ඡන්දයෙන්, ජනාධිපතිවරණයකින් නොවේ. ජනතාව ප්‍රතික්ෂේප කරන ලද රාජපක්ෂවරුන් සතුව පාර්ලිමේන්තුවේ තිබූ මන්ත්‍රී සංඛ්‍යාව මගිනි. එය ව්‍යවස්ථාවට එකඟ වුවද දේශපාලනයේ සදාචාරයට හා ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මවලට අනුව සදාචාර විරෝධීය; ප්‍රජාතන්ත්‍ර විරෝධීය. එබැවින් වත්මන් පාලනය මෙලෙස පැවැතීම ප්‍රජාතන්ත්‍රවාදයට පටහැණිය.

රනිල්-රාජපක්ෂ පාලනය දැන් පළාත් පාලන ඡන්දයද කල්දමා තමන්ට වැඩිබලයක් සහිතව මීට වසර 5කට පෙර ලැබුණු පළාත් පාලන ආයතනවල එම පැරණි බලයම පවත්වාගෙන යාමට උපාය සෙවීම කෙතරම් ප්‍රජාතන්ත්‍ර විරෝධී දැයි අමුතුවෙන් කිව යුතු නැත.

රනිල්ලා, රාජපක්ෂලා, පුංචි ඡන්දයට බියවීම පුදුමයට කරුණක් නොවේ. පුංචි ඡන්දය දැන් නියමිත ලෙස පැවැත්වුව හොත් ඉන් ස්ථිර ලෙසම රාජපක්ෂවරු පරාජය වෙති. (ඔවුනට ජයගත හැකි නම් ඔවුන් ඡන්දය කල් දැමීමට කටයුතු කරන්නේ නැත) එවිට පාර්ලිමේන්තුවේ ඔවුනට ඇති බලය ජනවරමක් නැති බලයක් බවට පත්ව එය අභියෝගයට ලක්වේ. එයට ඔවුන් බියය. අනෙක් අතට එම ඡන්දයට තරග කිරීමේදීද රනිල් හා රාජපක්ෂවරු බරපතළ ගැටලුවකටද මුහුණ දෙති. දැන් එක්ව ආණ්ඩු කරන ඔවුන් පුංචි ඡන්දයේදී වෙනම එ.ජා.ප.ය හා ශ්‍රී ලං.පො.පෙරමුණ ලෙස ඡන්දයට තරග වැදුන හොත් ආණ්ඩුව තුළ තිබෙන එකතුව බිඳී යයි. නැතුව පක්ෂ දෙකම එක්ව සන්ධාන ගත වුවහොත් එය බිම්මට්ටමේ පාක්ෂිකයන්ගේ විරෝධයට හේතුවේ. එබැවින් පුංචි ඡන්දය රනිල්ට හා රාජපක්ෂලාට මඟහැර යා යුතු අනතුරුදායක එකකි.



අනෙක් අතට පළාත් පාලන ආයතන අහෝසි වී ඒ සඳහා කොමසාරිස් පාලනයක් හැදීමද ඔවුනට අවාසිය. ඒ ඔවුන්ගේ බිමේ සංවිධායකයා වන පළාත් පාලන මන්ත්‍රීවරුන්ට මන්ත්‍රී බලය නැතිවන නිසාය. මේ සියල්ලද මැද දැන් රනිල් උත්සාහ කරන්නේ පළාත් පාලන මන්ත්‍රී සංඛ්‍යාව 'අඩු කිරීම' නම් සටන්පාඨයට මුවාවී ඒ සඳහා 'නව මැතිවරණ ක්‍රමයක්' සකස් කිරීම සඳහා යයි කියමින් ඡන්දය පැවැත්විය නොහැකි තත්වයක් ඇති කිරීමටය. මෙහි භයානකකම ඇත්තේ එහිය. මේ සඳහා ජනමත විචාරණයක් පවත්වන බවටද රනිල් අනියමින් තර්ජනයක්ද කර තිබේ.

## ඛේදජනකය හා විගඩම

පොදුවේ ගත් විට දැන් පෙනෙන්නේ ඉතිහාසයේ වරක් මාමා කළ දෙයම දැන් අලුත් ආකාරයකින් බෑනා විසින්ද කිරීමට උත්සාහ කරන බවය. 1982 දී මහ මැතිවරණය කල් දැමීමට ඊනියා ජනමත විචාරණයක් පවත්වා බලය තහවුරු කරගත් ජේ.ආර්. මාමා විශාල ඛේදජනකයක් වෙත රට ඇද දැමීය. දැන් බෑනාද පුංචි ඡන්දය කල්දැමීම වෙනුවෙන් එයම කිරීමට උත්සාහ කරයි. එය මාක්ස් සඳහන් කළ පරිදිම විගඩමක්ම වනු ඇත.

රනිල් බෑනාට දැන් රට තුළ ජයවර්ධන මාමා සතුව පැවැති විශාල බලය ඇත්තේ නැත. රනිල් ජනාධිපතිකම් කරන්නේ රාජපක්ෂවරුන් තම ආරක්ෂාව වෙනුවෙන් තිරය පසුපසට ගොස් රනිල්ට ලබාදුන් පිං ජනාධිපති ධුරයේය. ඔහුට පාර්ලිමේන්තුවේ සිටින්නේ එකම එක මන්ත්‍රීවරයෙකි. රටේ ජනමතය සාතිශය බහුතරයක් රනිල්ට මෙන්ම රාජපක්ෂවරුන්ටද විරුද්ධය. ජනාධිපතිවරයෙක් එලවා දැමීමට හා මහින්ද රාජපක්ෂට අගමැතිකම අත්හැරීමට බලකරන තරමේ දැවැන්ත මහජන නැගිටීමක් සිදුවූ එහි මතකය හා සටන්කාමිත්වය තවමත් පවතින දේශපාලන වටපිටාවක් තුළ මාමා කළ 'සෙල්ලම්' බෑනාද කිරීමට සිතන්නේ නම් එය විගඩමක්ම වනු ඇත.

මිනිසුන් තමන් අවට පරිසරය මැඩගෙන අලුත් යමක් කිරීමට උත්සාහ කරන අවස්ථාවල, සමාජ පරිවර්තනයක් සඳහා ජනතාව පෙරට එන අවස්ථාවල එය වැළැක්වීමට ප්‍රතිගාමී පාලක කණ්ඩායම් විවිධ උත්සාහ දරන බව ඉතිහාසය පෙන්වා තිබේ. පැරණි උපක්‍රම, පැරණි සටන් පාඨ ඒ සඳහා යොදා ගැනීමට ඔවුන් උත්සාහ කරන්නේ ප්‍රතිගාමී පාලක කල්ලිවලට අලුත් දෙයක් නිර්මාණය කිරීම නොහැකි නිසාය. ඔවුන් අතීතයේ ජීවත් වන අතීතය නියෝජනය කරන අය නිසාය. ඔවුන් මුහුණ පා ඇති පැරණි ක්‍රමය සමග විනාශ වී යාමේ අනතුරින් මිදීමට සියලු ප්‍රජාතන්ත්‍ර විරෝධී පැරණි උපක්‍රම යොදා ගත්තද ඉතිහාසයේ ගමන් මගට අනුව ඔවුන් පරාජය වන බව ස්ථිරය. ජනතාව ජයග්‍රහණය කරන බවද ස්ථිරය. එහෙත් එම ජයග්‍රහණයන් අත්පත් කර ගත යුත්තේ ප්‍රතිගාමී සතුරු කණ්ඩායම්වල, රනිල් - රාජපක්ෂ පමණක් නොව ඔවුනට අනියමින් සේවය කරන කණ්ඩායම්වලද අරමුණු හා ක්‍රියාමාර්ග ගැන ජනතාව අවදියෙන් හා අවබෝධයෙන් සිටීමෙන් පමණි.

> රට දැවැන්ත සමාජ ආර්ථික දේශපාලන අර්බුදයකට ඇදදමා ඇති රාජපක්ෂලා හා රනිල් වික්‍රමසිංහලා දැන් ඔවුන් නිතර මතුරන ඔවුන්ගේම ප්‍රජාතන්ත්‍රවාදය හෙවත් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයට පවා බියවී සිටිති; දේශපාලන සදාචාරයට අනුව බලනවිට, ගෝඨාභයට ජනාධිපති ධුරය අත්හැරීමට බලකරන තරමේ ජනතා විරෝධයක් රාජපක්ෂ පාලනයට එරෙහිව එල්ල වූ නිසා දැන් තවදුරටත් බලයේ සිටීමට රාජපක්ෂ පාලනයට අයිතියක් නැත.

# පොලිටිකල් පංතිය

වැස්ස පටන් ගන්නවත් එක්ක පොලිටික්ක පංතියට එන්න පරක්කු වුණා. ඒ අතරෙ ළමයි කාලෙ මරා ගන්න වැඩ යෝජනා කළා. ස්ථිර වුණු මංජුවගෙ යෝජනාව වුණේ පංතිය ඉස්සරහට ගිහින් කාව හරි අනුකරණය කරන එක.

"අයියෝ මේක පොඩි ළමයින්ගෙ කොන්සට් එකක් වගේනෙ?" කනිය ගේම ඉල්ලුව.

"හරි කොන්සට් එකක් වගේ තමයි" මංජුව කොන්දේසි හදනව. "හැබැයි මොන්ටිසෝරි වැඩ බෑ... හොඳට කරන්න ඕනෑ"

"හොඳට කරලා කොහොමද? හොඳටම කරපු කෙනාත් ගෙදර ඇරියනෙ..." චමියගෙ කතාවට කට්ටියට හිනා පැන්න.

"නෑ... මං තමයි හොඳටම කළේ කියල කිවුවෙ එයාමනෙ. ඇත්තටම අනිත් අයටයි එහෙම හිතෙන්න ඕනෙ. එකනෙ එයාට වැරදුනේ..." මංජුව සීරියස් කිවුව.

"හරි අපි කරල බලමු. මංජුම පළවෙනියට කාව හරි ඉමිටේට් කරන්නකො" වසන්තිය යෝජනා කරපු එකේ වාඩුව ගන්න බැලුව.

"හරි ඔයගොල්ල හිතා ගන්න. මම තමයි රනිල්" මංජුව පංතිය ඉස්සරහට ආවා.

"හොඳ වෙලාවට ඔයා කෙනා කිවුවෙ. නැත්තම් අපි දන්නෙ නෑනෙ..." සමනගෙ කතාවට මංජුවට ලැජ්ජත් හිතුණා.

"අනෙක ඔයාට රනිල් වෙන්න බෑ. ඔයාට හොර පෙනුමක් නෑනෙ?" කනිය ගේමටමයි.

"මට මොකටද හොර පෙනුමක්. මට තීන්න ඕනෙ 'ප්‍රජාතන්ත්‍රවාදී' දේශපාලක පෙනුමක්" මංජුව රනිල්ටම ඇන්දා.

"නෑ නෑ මහ බැංකුව කඩන්න තරම් හොර හිතක් තියෙන බවක් පේන්නෙ නෑ. ඔයාට තියෙන්නෙ අවංක පෙනුමක්. වරාය විකුණල චෙක් එක සාක්කුවට දාගත්ත කොටස ඔයාට කරන්න අමාරුයි. ඔයාට ජනතාව විදිහට අපි කියන ඒවට සංවේදී නොවී ඉන්න අමාරුයි..." කනිය තව මොන මොනවද කියන්න හදනව.

"මට ඔයාලගෙ අදහස් වැඩක් නෑ. මාව මෙතෙන්ට එව්වෙ ඔයාල නෙමෙයි. මමමයි 'ප්‍රජාතන්ත්‍රවාදීව' හිතල ආවෙ. කාටවත් වගකියන්න මම බැඳිල නෑ" මංජුව කිවුවෙ ඔරොප්පුවෙන් වගේ.

"අන්න එතකොටනම් නිකං රනිල්... රනිල් වගේ දැනෙනව" ඇහුණු මානෙ හැමෝටම හිනා පැන්නෙ සමනගෙ කතාවට.

"අරගලේ අතඇරලා පාපෝච්චාරණයක් කරලා අපිත් එක්ක ආවොත් සමාව දෙනව..." මංජුව කියල ඉවර වුණා විතරයි 'මේකා එහෙමත් කියනවනෙ කියාගෙන' තුන් හතරදෙනෙක් මංජුගේ හක්ක පන්නන්න වගේ පැන්න.

"අපොයි මේ මොකද? මං නැති වෙච්ච ටිකට ඇයි මේ? පොලිටික්ක පංතිය ඇතුලට කඩාගෙන දුවගෙන ආවෙ නරකම වෙලාවෙ.

"නෑ සර් මංජුව රනිල්ට ඇන්දා. ඊට පස්සෙ ඒකගෙ මල පනින කතා කියන්න ගත්ත" ඉස්සරහට පැනපු කවුරු හරි කිවුව.

"ඉතින් ළමයො රනිල් මහත්තය නරක දෙයක් කිවුවද?" පොලිටික්ක මංජුව නෙමෙයි රනිල්ව හෝදන්න හදනව. "සටන් කරපු අයට සමාව ගන්න කිවුවහම නරක දෙයක්ද?" පොලිටික්ක අහගෙන ඉඳල කියලත් අහුවුණා.

"අරගලේ හින්දම පුටුවට පැනගෙන අරගලේ අයට සමාව ගන්න කියන්නෙ කොහාමද? එයා තමයි ඉස්සෙල්ලම සමාව අරගෙන ඉල්ලා අස්වෙන්න ඕනෙ" චමිය ඇඟිල්ල දික්කළේ මංජුවට.

"බලන්න රනිල් මහත්තය කොයි තරම් ප්‍රජාතන්ත්‍රවාදීද කියල. තමන්ගෙම කැමැත්තෙන් බලතල අඩු කරගන්න 22වැනි සංශෝධනෙත් සම්මත කළානෙ" පොලිටික්ක චරිත සහතික ලියනව.

"දෙකහමාරෙන් විසුරුවන්නෙ නැතුව පොහොට්ටුවෙ අයට දිගටම බලේ ඉන්න දෙනව කියල පොරොන්දුත් වුණා. ඒ කියන්නෙ පෙන්ෂන් එක හදල දෙනව බය වෙන්න එපා කියන එකනෙ. අන්තිමට කන්දක් විලිලාලා මී පැටියෙක් වැදුව වගේ. මේ බහුබූත නිසානෙ අපි කිවුවෙ මේ ජනවරමක් නැති පාර්ලිමේන්තුව විසුරවලා අලුතෙන් පත්කරගන්න ඕනෑ කියල. පක්ෂ මාරු කරන එක තහනම් කරන්නෙ නැතුව, ඇමතිකම් බෙදන එක සීමා කරන්නෙ නැතුව ප්‍රජාතන්ත්‍රවාදය රකින්නෙ කොහොමද? ජනවරම වෙන්දේසි කරන්න විතරයි එයාලට පුළුවන්. පාර්ලිමේන්තුවෙන් තෝර ගත්ත රනිල්ට විධායක බලය ලැබෙන්නෙ කොහොමද? හරිනම් අනුප්‍රාප්තික ජනාධිපතිට තියෙන්න ඕනෑ මාස හයයි. ඊට පස්සේ ජනාධිපතිවරණයක් තියලා මිනිස්සුන්ට කෙනෙක් පත් කරගන්න අවස්ථාව තියෙන්න ඕනෑ. මේවා තමයි ඉක්මණටම ව්‍යවස්ථාවට ඇතුල් වෙන්න ඕනෑ දේවල්. අනෙක දැන් මේ රටටම හෙණ ගැහිලා තියෙන වෙලාවෙ කෑලි කෑලි හදලා වැඩක් නෑ; ජනතාවාදී ව්‍යවස්ථාවක්ම හැදෙන්න ඕනෑ... රනිල්ලත් වතුර රත්වෙනකම් නටන කකුළුවො වගේ. තාමත් මේ තක්කඩියො අඳුරන්නෙ නැතුව චරිත සහතික දෙන අයත් ඉන්නවනෙ..." සමන පටන් ගත්ත අයිටම් එකේ දෙවැනි කොටස විදිහට පොලිටික්ක දිහා නොබලම කතාව ඉවර කරනකොට අත්පුඩි පාරකුත් පටන් ගත්ත.




# අරගලකරුවනි! ඔවුන්ගෙන් ඉගෙන ගන්න...

මිනිස්සු ඉතිහාසයේ පහළ වූ විවිධ වර්ගයේ විරුවන් ගැන කථාකර තිබේ; ලියා තිබේ; දැනුදු එසේ කරති. එහෙත් යමෙකු සැබෑ 'මිනිස්' විරුවෙකු වන්නේ කෙසේද? කොටින්ම සැබෑ මිනිස් විරුවෙකු දේශපාලනිකව අපි තේරුම් ගන්නේ කෙසේද?

ස්වභාවධර්මය, මිනිස් සමාජය, මිනිස් චින්තනය නිරන්තර චලනයක හා වර්ධනයක පවතින බව විද්‍යාත්මක සත්‍යයයි. මෙම චලනයේ හා වර්ධනයේ නියාම ධර්ම නිසි ලෙස වටහා ගෙන අප ජීවත් වෙන මිනිස් සමාජය මිනිස් වර්ගයාගේ යහපත වෙනුවෙන් ප්‍රතිනිර්මාණය කිරීමට පවතින කාලකණ්ණි සමාජ ක්‍රමය වෙනුවට ඇත්ත මිනිස් සමාජයක් ගොඩනැගීම වෙනුවෙන් සටන් වදින මිනිස්සු අපට අනුව සැබෑ විරුවෝ වෙති. අප දැන් කථාකරන ඉල්මහා විරුවෝ යනු එවැනි වර්ගයේ මිනිස්සුය. ඔවුහු සටන් වැදුනෝ පෞද්ගලික ප්‍රතිලාභ වෙනුවෙන් නොව සමාජයට ප්‍රතිලාභ සඳහාය. තමන් ප්‍රාර්ථනා කරන ලෝකය තම ජීවිත කාලය තුළ යථාවක් කරගෙන එහි ඵල භුක්ති විඳීමට තමන්ට නොලැබෙන බව දැන දැනම ඔවුහු අනාගත පරපුර වෙනුවෙන් සටන් වැදුනහ. ඔවුහු අන් විරුවන්ගෙන් වෙනස් වන්නෝ ඒ නිසාමය. ඔවුන් එක් දිනකට, මසකට, වර්ෂයකට සීමා වුවෝ නොවෙති. ඔවුන් සුවහසක් ලොවපුරා විප්ලවවාදීන්ගේ හදවත් තුළ සදාකාලිකව ලැගුම් ගෙන සිටිති. ඔවුන් සොයා ගොස් ඔවුන්ගෙන් ඉගෙන ගෙන අනාගත උසස් මිනිස් සමාජය ගොඩ නැගීම වර්තමාන අපගේ කාර්යභාරය විය යුතුය. ඔවුන්ට හිමි නිසි ගෞරවය ලබාදීම යනු එයය.

ඔවුහු ඇති තරම් විවේචනවලට භාජනය වූවෝය; සතුරාගෙන් පහර පිට පහර කෑමට ලක්වූවෝය. එහෙත් ඔවුන් දල්වා ගිය 'මිනිස්' දේශපාලනයේ සිළුව සතුරාට නිවා දැමිය නොහැකි විය. අපි මෙසේ යෝජනා කරමු. ඔබට සැබෑම 'මිනිස්' අරගලකරුවෙකු වීමට අවශ්‍ය නම් ඉල්මහ විරුවන්ගෙන් ඉගෙන ගන්න. එය අනිවාර්යයි.



# රතු ඔක්තෝබරයේ පාඩම!



පංතිය සහ ව්‍යාපාරය සංවිධානය කොට එයට නායකත්වය දීමට සමත් පෙරමුණු නියෝජිතයින්ගෙන් තොරව කිසිදු පංතියක් බලයට පැමිණ නැති බව රුසියානු සමාජවාදී විප්ලවයේ අත්දැකීම් අනුව ලෙනින් බැසගත් නිගමනයයි. කම්කරුවන් ප්‍රමුඛ පීඩිතයන්ගේ දේශපාලන නායකයා වන්නේ මාක්ස්වාදී පක්ෂයයි. මේ ලෙනින්ගේ නිගමනයයි.

1917 ඔක්තෝබර් (වර්තමාන දිනදර්ශනයට අනුව නොවැම්බර්) රුසියාවේ සිදුවූ සමාජවාදී විප්ලවය ගැන සමහරු විසින් විවේචන කඳු ගසා ඇත. එහෙත් සෝවියට් දේශයේ කඩා වැටීමෙන් 'සමාජවාදය ඉවරයි' 'කපෝතියි' යන මුග්ධ නිගමනයට ඒමට තරම් අපි පහත් නොවමු. කුහකද නොවෙමු. සෝවියට් සමාජවාදී රාජ්‍ය ගොඩනැගී පසුව බිඳවැටී අදට වසර 105ක් ගතවී ඇත. ඒ ගැන දේශපාලන විවරණයක් කිරීමට අපට මෙහි ඉඩකඩ නැත. එහෙත් සමාජය වෙනස් කිරීම සඳහා සැබෑ වුවමනාව සහිතව අරගල කරන කාහට වුවද වැදගත්වන සහ සිහියේ තබාගත යුතු මූලිකම කරුණ ගැන ලෙනින් කළ අවධාරණය වත්මන් සටන්කරුවන්ට අතිශයින්ම වැදගත්ය.

"ස්වේච්ඡාවෙන් පැන නගින පීඩිතයන්ගේ සටන් ව්‍යාපාරයට ඉදිරියෙන් යමින් එයට නියම මඟ පෙන්වමින්, සටන්වලදී ඔවුන් මුහුණ පාන සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයමින්, එය සංවිධානය කරමින්, නොදියුණු කම්කරුවන් දියුණු තත්වයට පත්කරමින් වැඩ කිරීමට සංවිධානයක් හෙවත් පක්ෂයක් අවශ්‍යමය. දියුණු සංවිධානාත්මක පක්ෂයකින් තොරව පක්ෂයක හිසට උඩින් ගොස් සමාජ පරිවර්තනයක් කිසිදා කළ නොහැක.

දේශපාලන හැඟීම් සහ දැනීම් වඩාත් මුහුකුරා ගිය සංවිධානාත්මක හා නිර්භය වූද විප්ලවයට කැපවූද මිනිසුන් සාමාජිකයන් ලෙස බඳවා ගැනීමන් දියුණු පක්ෂයක් ගොඩනැගෙන්නේ හා එහි නායකත්වය ගොඩ නැගෙන්නේ" මේ ලෙනින්ගේ නිගමනයයි. සැබෑ අරගලකරුවන් නිරන්තර සිහියට නැගිය යුතු නිගමනයයි. ඔක්තෝබර් විප්ලවයේ හොඳම පාඩමයි. අප උගත යුතු කදිම පාඩමයි.

# රනිල්ගේ රාජකීය සවාරිය

"රනිල් රෝයල් කොලීජියට ගියේ එහි ළමුන් විඳින අනේකවිධ දුෂ්කරතා හා ඔවුන්ගේ දුක සැප සොයා බැලීමටය. "සර් අපිට කන්න නෑ. සමහරු ඊයේ රෑටත් කාල නෑ. අද උදේත් ළමයි දහදොළොස් දෙනෙක් රැස්වීමේදී කලන්තෙ දාලා වැටුණා. බලන්න අපේ ඇඳුම්වල හැටි. මේ ඇඳුම තමයි අපි ගෙදර ගිහිල්ලා හෝදලා දාලා බාගෙට වේලගෙන හෙට උදේත් ඇඳගෙන එන්නේ. අපිට පොත් නෑ. පෑන් නෑ. අපේ තාත්තලා වැඩි හරියක් කරන්නෙ කුලී වැඩ. ස්කූල් වෑන්වලට දෙන්න අපිට සල්ලි නෑ. අපි කිලෝමීටර භාගයක් ගෙවාගෙන මහ කැලෑව මැද්දෙන් තමයි ඉස්කෝලේ එන්නේ. ගෙදරින් පිටත් වෙන්නෙ පාන්දර කළුවරේ. මේ ළඟදිත් වල් අලි ගහල අපේ කිහිපදෙනෙක් මළා... ළමෝ දිගටම රනිල්ට තම දුක කියාගෙන කියාගෙන ගියෝය." "හා.. ඇති... ඇති.." රනිල්ගේ විධානයට ළමෝ නිහඬ වූහ. "මම හෙටම ඔය ළමයිගෙ ප්‍රශ්න විසඳීමට වහාම පියවර ගන්නවා" කියා රනිල් රාජකීය විද්‍යාලයෙන් වාහන පිරිවරාගෙන පිටව යන අයුරු කිළිටු පෙරාගත් ළමෝ විස්සෝපයෙන් බලා සිටියෝය..."

මොනරාගල, ඇඹිලිපිටිය ආදී දුෂ්කර පළාත්වල මෙන්ම නාගරික අගනාගරික ප්‍රදේශවල පවා අතිශය දුෂ්කර පාසල් තිබෙන බව වත් ඒවායේ ළමුන් ප්‍රශ්න කෝටියකින් දුක් විඳින බවත් රාජකීය රනිල් නොදනී. ඔහු දන්නා එකම පාසල රෝයල් කොලීජිය පමණක් විය හැක. අධ්‍යාපන ඇමතිකම වසර ගණනාවක් දැරූ, පාසල් ළමයින් ඇතුළු තරුණ තරුණියන් දස දහස් ගණනක් වළපල්ලට යැවූ බවට චෝදනා ලැබූ මිනිසෙකි, මේ පාසල් ළමුන්ගේ දුකසැප විමසන්නේ. ඒත් රාජකීය විද්‍යාලයේ ළමුන්ගෙනි.

පාසලකට පය ගැසීමටවත් නොහැකිව පාසල් ගියද හරිහැටි ඇඳුමක් නැති, කෑමක් බීමක් නැති නැතිනම් බඩගින්නේම ඉඳ කලන්තෙ දා ඇද වැටෙන ළමුන් පාවහන් යුවලක් නැති ළමුන්, දිරාගිය ගොඩනැගිලි සහිත පාසල්, කිසිදු පහසුකමක් නැති පාසල් සහ දූ දරුවන් දස දහස් ගණනක් මේ රටේ තිබෙන බව මේ කිසිදු තෙතමනයක් නැති පාලකයන්ට නොතේරේද? නැතිනම් ඒවා ඔවුනට අදාළ නැත්තා සේද? මහා එවුන්ට බැරිනම් පොඩි එවුන් එකතු කරගෙන මේ අමන හැත්ත සදහටම මේ රටින් තුරන්කර දැමිය යුතු නොවේද?



ඔක්තෝබර් 07

# අර්බුදයෙන් ගොඩඒමට සමාජය විශ්වාසයෙන් යුතුව ඒකරාශී විය යුතුයි

*(ජනාධිපතිවරයාගේ විශේෂ ප්‍රකාශය සම්බන්ධයෙන් පැවති විවාදයට සහභාගී වෙමින්)*

## ජාතික ජන බලවේගය පාර්ලිමේන්තු කණ්ඩායම් නායක අනුර දිසානායක සහෝදරයා

ජනාධිපතිවරයා සැම විවාදයකදීම ඉදිරිපත් කළේ අභියෝගයක් තිබෙන අවස්ථාවක කිසිවෙකුත් පාලනය බාර නොගත් නිසා එතුමා බාරගත් බවයි. සමාජය තුළත් එවැනි අදහසක් පතුරවා තිබෙනවා. නමුත් අපේ අදහස වන්නේ එතුමා බාරගත්තා නොවෙයි එතුමාව තෝරා ගත්තා කියලයි. ඒ කුමක් වෙනුවෙන්ද? ජනාධිපතිවරයෙක් තෝරාගැනීමට පාර්ලිමේන්තුව තුළ ඡන්ද විමසීමක් පැවැත්වූවා. එහිදී 134ක් විසින් ඔහුව තෝරා ගත්තා. ඒ වන විටත් දේශපාලනික වශයෙන් බිත්තියටම හේත්තුවෙලා සිටි රාජපක්ෂ කඳවුර බේරා ගන්න ඔහුව තෝරාගත් බව මතක තබාගන්න. නිසි පරිදි මැතිවරණයක් පවත්වා ජනතාවගේ කැමැත්ත අනුව රටේ වගකීම් බාරගන්න. ඇත්ත බාර ගැනීම ඒකයි.

### සූත්‍රවලට කලින් පන්සිල් රකින්න

බුදුන් වහන්සේ දේශනා කළ කූට දන්ත සූත්‍රය එතුමා උපුටා දැක්වූවා. යථාපරිදි උපදෙස් ගැනීම, ප්‍රශ්නය යථාපරිදි හඳුනාගැනීම, සමස්තයක් ලෙස විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීම සහ ඒ විසඳුම් විශ්වාසවන්ත ලෙස ක්‍රියාත්මක කිරීම තමයි කූට දන්ත සූත්‍රයේ හරය. ප්‍රශ්නවලට ප්‍රවේශවීම සඳහා විවිධ දාර්ශනික අදහස් තිබෙනවා. ගැටලුවක් හඳුනාගැනීම සඳහා එහි ඓතිහාසිකව වර්ධනය වූ ආකාරය සොයන්න ඕනෑ. අපේ රටේ ආර්ථික අර්බුදය වර්ධනය වුණු ඓතිහාසික සාධක තේරුම් ගන්න ඕනෑ. ඒ වගේම ගැටලුව දැන් පවතින ආකාරය ඒ කියන්නේ ණය බර, උද්ධමනය, ජන ජීවිතවලට බලපෑම වගේ දැන් පවතින තත්වය තේරුම් ගන්න ඕනෑ. ඊට පස්සේ ගැටලුවට පවතින අන්තර් සම්බන්ධතාවය ගැන සොයා බලන්න ඕනෑ. ඒවා ඉතාමත් විද්‍යාත්මක, දාර්ශනික පදනම්. රනිල් වික්‍රමසිංහ මහත්මයාට මම යෝජනා කරනවා බැරෑරුම් සූත්‍රවලට යන්න කලින් ගිහියෙක් විසින් පිළිපැදිය යුතු පන්සිල් පදවලින් දෙවැනි සිල්පදය ආරක්ෂා කරන්න කියලා. එහෙම නම් අදටත් මහ බැංකුව නිරුපද්‍රිතව පවතිනවා. ඒ නිසා දෙවැනි සිල්පදය වත් ආරක්ෂා කරන්න කියලා එතුමාටත් එතුමාගේ ආණ්ඩුවේ ඉන්න ගෝලබාලයින්ටත් මම කියනවා.

මළකඳන් මතින් බලය ගන්න සමහර දේශපාලන ව්‍යාපාර කැමැත්තෙන් ඉන්න බව එතුමා කියනවා. ඒක භයානක ප්‍රකාශයක්. මළකඳන් පිළිබඳ භීතිකාවක් සමාජයේ නිර්මාණය කරන්නේ බලය දරාගන්න බැරිවුණු, සමාජයේ ප්‍රශ්නවලට නිසි විසඳුම් සොයා ගන්න බැරිවුණු පාලක කණ්ඩායම්. දේශපාලන ව්‍යාපාරවලට, සිවිල් සංවිධානවලට, මහජනතාවට උද්ඝෝෂණ පැවැත්වීමේ අයිතිය තියෙනවා. එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහත් ගාල්ලේ සිට කොළඹට උද්ඝෝෂණ පා ගමනක් ආවා. ලිප්ටන් වට රවුමේ කතාවක් පවත්වලා අනික් අය කතාකරයි කියලා, එතුමා මයික් එකත් උස්සගෙන ගියා. හැබැයි යන යන තැන පොලීසියෙන් අවසර ගත්තේ නැහැ. දැන් සාමකාමී උද්ඝෝෂණවලට මඟ හරස් කොට පහර දෙනවා. අපේ තරුණ ව්‍යාපාරය ලිප්ටන් වටරවුමේ සිට කොටුව දුම්රියපොළ දක්වා උද්ඝෝෂණ පාගමනක යෙදෙන බව පොලීසියට දැනුම්දී තිබුණා. එසේ තිබියදීත් මඟ හරස්කර පහර දුන්නා. ප්‍රචණ්ඩකාරීත්වය, රටේ ලේ වැගිරීමක් අවශ්‍ය වී තිබෙන්නේ කාටද? අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ වසන්ත මුදලිගේ ඇතුළු තුන්දෙනෙක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවේ හිරකරගෙන ඉන්නවා. මර්දනකාරීත්වයත්, මළමිනී මතින් තම බලය තහවුරු කර ගැනීමත් අවශ්‍ය කාටදැයි මෙයින් පෙනෙනවා. අපි ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ක්‍රියාකරන, වේදනාකාරී අත්දැකීම්වලින් බැට කෑ, දේශපාලන ව්‍යාපාරයක්. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම සඳහා මැදිහත් වෙන ව්‍යාපාරයක්.

> රනිල් වික්‍රමසිංහ මහත්මයාට මම යෝජනා කරනවා බැරෑරුම් සූත්‍රවලට යන්න කලින් ගිහියෙක් විසින් පිළිපැදිය යුතු පන්සිල් පදවලින් දෙවැනි සිල්පදය ආරක්ෂා කරන්න කියලා. එහෙම නම් අදටත් මහ බැංකුව නිරුපද්‍රිතව පවතිනවා.

### රට වැටී තිබියෙදීත් විනිවිදභාවයක් නැහැ

එතුමා ඉදිරිපත් කරන ප්‍රකාශයේ පියවර කිහිපයක් සඳහන් කරනවා. ආර්ථිකය හැකිළී, උද්ධමනය ඇතිවීමෙන් සිදුවන තත්වය වළක්වා ගන්න, මූලික පාරිභෝගික භාණ්ඩ සඳහා උපරිම මිල සීමාවක් නියම කිරීම. හාල්වලට, කිරිපිටිවලට, සීනිවලට, විතරක් නොවෙයි පොල්වලටත් මිල තීරණය කිරීමේ ගැසට් නිවේදන ගැහුවා. ඒ මිල ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අවශ්‍ය පරිදි භාණ්ඩ හා සේවා නිෂ්පාදනය නොවෙනවා නම්, අනිවාර්යයෙන්ම කළුකඩ මිලක් නිර්මාණය වෙනවා. මිල නියම කිරීම ක්‍රියාත්මක කළ හැක්කේ සාධාරණ ලෙස, නිසි ගුණාත්මකභාවයෙන්, අවශ්‍යතාවය සඳහා භාණ්ඩ සැපයිය හැකිනම් පමණයි. ඊළඟට ඔහු කියනවා දේශීය නිෂ්පාදන සඳහා තිබෙන බාධක



ඉවත් කරන බව. මෙපමණ කල් රෝහල්වලට අවශ්‍ය ගෝස් 100%ක් දේශීය නිෂ්පාදකයින් ලබාදුන්නා. නමුත් දැන් චීනයෙන් ගෙනත් දෙන්න ටෙන්ඩරයක් කැඳවා තිබෙනවා. ගෝස් නිෂ්පාදකයෝ 450ක් පමණ සිටියා. කෝවිඩ් කාලයේ සියයක් පමණ හැලුණා. ඉතිරි අය අසීරුවෙන් නිෂ්පාදන කරන එකත් නැතිකර චීනයට වෙළඳපොළ හදාදෙන්න ක්‍රියා කරනවා. දේශීය නිෂ්පාදන දිරිගන්වනවා කියන්නේ බොරු.

තුන්වෙනුව විදේශ විනිමය ගලා ඒම ඉහළ නැංවීමට විනිමය රෙගුලාසි ලිහිල් කරන බව කියනවා. කළු සල්ලි සුදු කිරීමේ පනතක් පාර්ලිමේන්තුවේ සම්මත කර දී පසුගිය මාර්තු 31වැනිදා සිට බලපැවැත්වෙනවා. තව ලිහිල් කරන්නේ මොනවාද? කළු ධනය සුදුකර ගැනීම සඳහා නීති සම්පාදනය කර දුන්නත් විදේශ විනිමය ආවාද? අද පවතින තත්වය අනුව ලිහිල් කිරීම් සිදුවෙන්නේ ලංකාවට ගලාගෙන එනවාට වඩා ලංකාවෙන් ගලායාම තව තවත් වැඩිවීමයි. ඊළඟට අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය වළක්වා ගැනීමට නීති පනවන බව කියනවා. දැනටමත් ඒක කරලා තිබෙන්නේ. සම් භාණ්ඩ, බතික් නිෂ්පාදකයෝ ඇතුළු සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවෝ රැසක් බිඳ වැටීමේ තර්ජනයකට ලක්වී සිටිනවා. එතුමාගේ පස්වෙනි යෝජනාව විනිවිදභාවයෙන් කටයුතු කරන විවෘත වෙළඳපොළක්. සීනි බදු, පොල්තෙල් බදු වංචාවන් කළේ කවුද? රට ආර්ථික වශයෙන් කඩා වැටී තිබෙන වෙලාවෙත් ගල් අඟුරු, ඉන්ධන ආනයනය විනිවිදභාවයෙන් කරන්න බැරිවෙලා තිබෙනවා.

තැන්පත් සඳහා පොලී සීමාවන් පනවා පොලී අනුපාතික සීමිත මට්ටමක පවත්වා ගන්න බව ඊළඟට කියනවා. භාණ්ඩාගාර බැඳුම්කර, බිල්පත්වල පොලී අනුපාතිකයට වඩා බැංකු පොලී අනුපාතිකය ඉහළ මට්ටමක රඳා පැවතුණා. අද භාණ්ඩාගාර බැඳුම්කර 32% පොලියට නිකුත් කරනවා. මේ නිසා බැංකු පොලී අනුපාතික 25% පමණ දක්වා ඇවිත් තිබෙනවා. මේ නිසා සෑම ක්ෂේත්‍රයක්ම පොලී අනුපාතික ඉහළ යාම සිදුවී තිබෙනවා. සෑම ක්ෂේත්‍රයක්ම කඩා වැටීමට ලක්වෙලා. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ මේ යෝජනා හය කිසිදු ප්‍රතිඵලයක් නැති අසාර්ථක ඒවා බව සනාථ කර තිබෙනවා.

### ජන කැමැත්තට සරිලන ආණ්ඩුවක්

මහබැංකුවේ අධිපතිවරයා ණය ආපසු නොගෙවන බව ප්‍රකාශ කිරීම, රටේ බංකොලොත් බව නිල වශයෙන් පිළිගැනීමක්. ණය නොගෙවීමට තීරණය ගැනීමත් සමග අනිවාර්යයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත යා යුතුයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පළමු කොන්දේසිය ණය ප්‍රතිව්‍යුහගත කිරීමයි. ආසන්න වශයෙන් ඩොලර් බිලියන 13ක ණය ප්‍රතිව්‍යුහගත කරගන්න ඕනෑ. දේශීය වශයෙන් ලබාගෙන තිබෙන වානිජ වෙළඳපොළ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී බරපතළ තත්වයක් ඇති වෙනවා. දැනටත් අපේ වාණිජ බැංකුවල රුපියල් බිලියන 500ක ද්‍රවශීලතා හිඟයක් පවතිනවා. රටේ බැංකු පද්ධතිය විශාල අවදානමක පවතිනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවැනි කොන්දේසිය ණය තිරසාර කිරීමයි. ඒ වෙනුවෙන් බදු වැඩිකර වියදම් විශාල වශයෙන් කපා හැරිය යුතු වෙනවා. 2025දී ජංගම ගිණුමේ අතිරික්තය දළ ජාතික නිෂ්පාදිතයෙන් 2.3%ක් ලෙස මූල්‍ය අරමුදලට පෙන්විය යුතුව තිබෙනවා. මේ නිසා ආණ්ඩුවේ ආදායම් වැඩි කර ගැනීමට බදු පිට බදු ගහමින් යනවා. වැට් බදු, සමාජ ආරක්ෂණ බද්ද, රැඳවුම් බද්ද ඇතුළු අතිරේක බදු ගණනාවක් හඳුන්වා දී තිබෙනවා.

මේ බදු බර ජනතාවට දරාගන්න බැරි පීඩාවකට පත්වෙනවා. ඊට එරෙහිව ජනතාව නැගිටින බව මහ බැංකුවේ අධිපතිවරයා පාර්ලිමේන්තු කාරක සභාවකදී, කියා තිබුණා. 2020 සිට අපි මේ අර්බුදය පෙන්වා දුන්නා. ආණ්ඩුවේ මන්ත්‍රීවරු එදා පුරසාරම් දෙඩුවා. රට මුළුමනින්ම අගාධයට වැටුණාට පස්සේ කියනවා අපිට වැරදුණා කියලා. අදත් අපි කියන්නේ ඉදිරියේ විශාල අඳුරු අගාධයක තිබෙන්නේ. මේ අර්බුදයෙන් ගොඩඑන්න සමාජය විශ්වාසවන්තභාවයෙන් ඒකරාශි විය යුතුයි. සමාජයේ විශ්වාසය ගොඩනගන්න නම් මැතිවරණයකින් ජනතාවගේ කැමැත්තට සරිලන ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට අවස්ථාව සලසා දිය යුතුයි.

*05වැනි පිටුවෙන්*

## අධ්‍යාපන ආයතන තුළ පසුගාමිත්වයට...

නායකයින් සහ ශිෂ්‍ය සංගම් මර්දනයට පාර කපාගන්නේ. ශිෂ්‍ය ව්‍යාපාරය මර්දනය කරන්න වගේම මර්දනය කිරීමට එරෙහිව ශිෂ්‍ය ව්‍යාපාරය එකතු කිරීමට නොහැකිව සුණුවිසුණු කරන්නත් මේ නවකවදය හේතුවක් වී තිබෙනවා.

ඒ වගේම පාලකයින්ගේ සහ අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීම වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම්වල සටන් පාඨයක් තමයි අපේ රටේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය වැඩක් නැහැයි කියන එක. ඔවුන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් අමනුෂයින් බවට ජනතාව තුළ මත ගොඩනඟනවා. එමගින් රාජ්‍ය විශ්විවද්‍යාල පද්ධතිය ඇදවැට්ටවීම සහ ඒ පිළිබඳ ජනතාවගේ ආකල්ප බිඳවැට්වීම අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීම යෝජනා කරන කණ්ඩායම්වල මතවාදී අවියක් වී තිබෙනවා. ඒ අනුවත් මේ නවකවදය ක්‍රියාවලිය අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමේ මතවාදය ඉදිරියට ගෙනියන්න, සාධාරණීකරණය කරන්න සැලකිය යුතු දායකත්වය සපයා තිබෙනවා. එපමණක් නොවෙයි අරගලවල ඉන්න විශ්විවිද්‍යාල ශිෂ්‍යයන් පිළිබඳව වැරදි මතවාදයක් හදන්නත්, රටේ සමස්ත අරගලවලින් ශිෂ්‍යයන් හුදකලා කරන්නත්, ඒ මගින් රටේ සමස්ත අරගලය දුර්වල කරන්නත් නවකවදය භාවිත කරනවා.

***නියමුවා:- ශිෂ්‍ය ව්‍යාපාරය හමුවේ පවතින අභියෝග ජයග්‍රහණය කිරීමට සමාජවාදී ශිෂ්‍ය සංගමයේ සූදානම සහ වැඩපිළවෙළ කුමක්ද?***

අද ජනතාව ආර්ථික අර්බුදය නිසාත් සමාජ අර්බුද නිසාත් පීඩාවට පත්වෙලා ඉන්නේ. ශිෂ්‍යයින්ටත් ඒ වගේමයි. අධ්‍යාපන උපකරණ ගැනීම නොහැකියාව, අධ්‍යාපනය කරගෙන යාමට යහපත් වටපිටාවක් නැතිකම නිසා අද ශිෂ්‍යන්ට අධ්‍යාපනය හැදෑරීම අභියෝගයක් වෙලා තිබෙනවා. එයට එරෙහිව සටන් කරන්න වෙලා. අනික් පැත්තෙන් ආණ්ඩුව උත්සාහ කරමින් ඉන්නවා ආර්ථික අර්බුදය හේතුවක් කරගෙන අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමට. ඒ සඳහා ආයතන නිර්මාණය කරනවා වගේම රාජ්‍ය විශ්වවවිද්‍යාලය තුළත් අධ්‍යාපනය විකිණීම සඳහා වැඩපිළවෙළවල් සකස් කෙරෙමින් තිබෙනවා. ඊට එරෙහිව අරගල කිරීමේ අභියෝගයත් තියෙනවා. ශිෂ්‍ය ව්‍යාපාරය අරගල කළේ අපේ රටේ ශිෂ්‍ය අයිතිවාසිකම් සඳහා පමණක් නොවෙයි. ශිෂ්‍ය අයිතිවාසිකම් දිනාගැනීමේ සටනින් එහාට ගොස් ජනතා අයිතිවාසිකම් දිනාගැනීමේ සටනෙත් ඉදිරියෙන්ම ශිෂ්‍ය ව්‍යාපාරය ඉන්නවා. ඒ නිසා දවසින් දවස ගොඩනැගෙන ජනතා අරගල වෙනුවෙන් ශක්තිමත් දායකත්වයක් සැපයීමේ අභියෝගයද ශිෂ්‍ය ව්‍යාපාරයට තියෙනවා.

අද අරගලය ගොඩනැගී තිබෙන්නේ සිස්ටම් චේන්ජ් එකක් වෙනුවෙන්. ක්‍රම වෙනසක් ගැන කතා කරනවා. ඒ ක්‍රම වෙනසට අදාළව ශිෂ්‍යයා ගොඩනගන්නේ කොහොමද? පසුගාමී මානසිකත්වයන්, සංස්කෘතික ලක්ෂණයන්, ඒවා අභාවයට යැවීමේ නොකැමැත්ත මේවා ශිෂ්‍ය ව්‍යාපාරයට මුහුණ දීමට ඇති අභියෝගයි. නවකවදය වැනි දේ තුළින් පෙනීයන්නේ මේ සමාජයේ පවතින පසුගාමී ලක්ෂණයි. මේවාට අවසන් වශයෙන් පිළිතුරු ලැබෙන්නේ එවැනි පසුගාමී ලක්ෂණ බිහිවීමට වටපිටාවක් නොමැති සමාජයක් ගොඩනැගීම තුළින්ම තමයි. එහෙත් ඒ අවසන් පිළිතුර ලැබෙන තෙක් අපට පැත්තකට වී බලාසිටිය නොහැකියි. ඒ නිසා මේ පසුගාමී මතවාදයන් සහ ක්‍රියාකාරිත්වයන් ඉබේ නැතිවෙන තෙක් නොසිට උසස් අධ්‍යාපන ආයතන තුළින් ඉවත් කර දමන්න අපට ශිෂ්‍ය ව්‍යාපාරය මෙහෙයවන්න වෙනවා. එහෙම වුණොත් තමයි,'සිස්ටම් චේන්ජ්' එකක් වෙනුවෙන් පෙනී සිටින ශිෂ්‍යයෙක් ගොඩනැගිය හැකි වන්නේ. ඒ සියල්ලත් එක්ක මේ සිදුවීම්වලට එල්ලවන මඩ ප්‍රහාරයන්ටත් මුහුණ දීමේ අභියෝගය තිබෙනවා.

ඒ තුළ සමාජවාදී ශිෂ්‍ය සංගමය විදිහට මේ අභියෝග ජයග්‍රහණය කිරීමට ශිෂ්‍යයින්ට මඟපෙන්වීම සඳහාත් එය ප්‍රායෝගික තලයට රැගෙන යන්නත් අවශ්‍ය මැදිහත්වීම් කරනවා. මේ වෙනුවෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇතුළු ප්‍රගතිශීලී සංවිධාන සහ පුද්ගලයින් සමග සාකච්ඡා කරමින් සිටිනවා. අරමුණු සහගත මැදිහත්වීමක් තුළ මේ සියලු තත්වයන් වෙනස් කර, සියලු අභියෝගයන් ජයග්‍රහණයෙන් අවසන් කරගන්න හැකිවේවි යැයි අපි දැඩිසේ විශ්වාස කරනවා. ඒ සඳහා සමාජවාදී ශිෂ්‍ය සංගමය අඛණ්ඩව මැදිහත්වෙනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් හමුවී..



ජපාන තානාපති මුණගැසී...



නවසීලන්ත රාජ්‍යතාන්ත්‍රිකයින් හමුවී...



ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය හමුවී..




ඉතාලියේදී සහෝදරත්වයේ දිනය සමරා...




චේ දින සැමරුම වෙනුවෙන්...

# ජන සටනට මෙන්ම මැතිවරණයටද කොට්ඨාස සභා සූදානම් විය යුතුයි



ජාතික ජන බලවේගයේ නායක

**අනුර දිසානායක සහෝදරයා**

ජාතික ජන බලවේගය බලය ලබාගැනීම සඳහා ඡන්දවලට සූදානම් වන නමුත් ආණ්ඩුවට ලැබුණු ජනවරම මේ වන විට නොමැති බව අනාවරණය වන බැවින් සහ ගම් මට්ටමේදී රනිල්ලාට සහ රජපක්ෂවරුන්ට එකට එකතු වී මැතිවරණයට ඉදිරිපත් විය නොහැකි බැවින් ආණ්ඩුව ඡන්ද පැවැත්වීමට බියවී සිටින බව පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා, ජාතික ජන බලවේගයේ කොට්ඨාස සභා විශේෂ වගකීමක් ගනිමින් ජන සටනට නායකත්වය දීම මෙන්ම මැතිවරණයට සූදානම් වීමද කළ යුතුව ඇති බව අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 15වැනි දින පැවති ජාතික ජන බලවේගයේ කැස්බෑව ආසන සමුළුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මේ රට ගොඩනගන්න එකිනෙකා හඹා ගොස් පරාජය කිරීමේ මනෝභාවය වෙනුවට රට ගොඩනැගීමේ සාමූහික හැඟීමකින් එකතු වෙන්න ඕනෑ. අනෙකාගේ වේදනාව මගේ වේදනාව බවට පත් වෙන්නේ කොහොමද කියන සාමූහික හැඟීමක් අපට අවශ්‍යයි. එසේ නැතිව උඩින් ආණ්ඩුවක් අටවා ගත් පමණින් රටක් හදන්න බැහැ. සමාජයේ ආකල්ප පරිවර්තනයක් අවශ්‍යයි.

කොට්ඨාස සභාවක මූලික කාර්යභාරයන් තුනක් තිබෙනවා. ජනතාවගේ නැගිටීමට නායකත්වය දීම. එළඹෙන ඡන්දයේදී කොට්ඨාසය ජයග්‍රහණය කරවීම සහ කොට්ඨාසය තුළ ජනතාවගේ පරිවර්තනයක් ඇති කිරීම සඳහා සිදු කරන සාකච්ඡාවක් ගෙන යාම ඒ කාර්යභාරයන් තුනයි. මේ කටයුතු සාර්ථක ලෙස කළහොත්, අපට ජයග්‍රහණය ලබන්න පුළුවන්. අපේ රට ගොඩනැගිය හැකි අදූෂිත, අවංකභාවයෙන් යුක්ත කණ්ඩායම ඉන්නේ ජාතික ජන බලවේගයේ පමණයි. වෙනදාට වඩා වැඩියෙන් අප දිහා බලන්න, කැමැත්තක් දක්වන ජනතාවක් අද ඉන්නවා. ඔවුන්ගේ විශ්වාසය තහවුරු කර ගනිමින්, එළැඹෙන පළාත් පාලන මැතිවරණයේ දී විශාල ජයග්‍රහණයක් ලබා ගත යුතුයි. ඊළඟ මහා මැතිවරණයේදී අපේ ආණ්ඩුවක් පිහිටුවීම පිළිබඳ සංඥාව ඒ පළාත් පාලන මැතිවරණයෙන් ලබා දිය යුතුයි. ඒ සංඥාව හරියට ලබා දුනහොත්, ඉතා කෙටි කාලයක් ඇතුළත අනිවාර්යයෙන්ම මහා මැතිවරණයෙන් අපට බලය ගන්න පුළුවන්. මේ රට බෙදවාචකයකට හෙළපු මේ තත්වයෙන් ගොඩගන්න වෙන කිසිවකුට බැහැ. ඒ නිසා මේ දුර්දාන්ත කණ්ඩායම පරාජයට පත් කොට ජනතාවාදී පාලනයක් ස්ථාපනය කිරීමට අපි හැම දෙනාම පෙළගැසෙමු."

# මැතිවරණ කල්දැමීමට එරෙහිව සටන් වදින්න සූදානම්




ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම්

**විජිත හේරත් සහෝදරයා**

පළාත් පාලන මන්ත්‍රී ධුර ප්‍රමාණය වැඩි කළ රනිල් වික්‍රමසිංහ මේ වන විට මන්ත්‍රී ධුර ප්‍රමාණය බරක් යැයි කියමින් මැතිවරණ කල්දැමීමට සූදානම් වන බැවින් ඔහුගේ ව්‍යාජ කතාවලට නොරැවටෙන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, මැතිවරණ කල්දැමීමට එරෙහිව සිවිල් සංවිධාන සහ බහුජන සංවිධාන සමග එක්ව සටන් වදින බවත් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය යටපත් කරන්න ඉඩ නොදෙන බවත් අවධාරණය කළේය.

විජිත හේරත් සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 10වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදී අදහස් දක්වමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"සැප්තැම්බර් 20වනදා සිට ලබන මාර්තු මාසයේ මැද අතරතුර කාලයේ ඕනෑම අවස්ථාවක පළාත් පාලන මැතිවරණය පවත්වන්න බලය මැතිවරණ කොමිසමට ලැබී තිබෙනවා. නියෝජිතයින් 4000ක් දක්වා අඩුකරන්න නම් දැනට තිබෙන කොට්ඨාස වෙනස් කරන අලුත් සීමා නිර්ණයකට යන්න වෙනවා. අන්න ඒ සීමා නිර්ණය පාවිච්චි කර ප්‍රජාතන්ත්‍ර විරෝධී විදියට කල් දැමීම වෙනුවෙන් උපක්‍රමයක් යොදා ගන්න හදනවා. ප්‍රජාතන්ත්‍ර විරෝධීව ඡන්දය කල්දැමීම වහාම නතර කරන ලෙස අපි ආණ්ඩුවට බල කරනවා.

ඡන්ද කල්දමන ක්‍රමවේදය රනිල් එදා ඉගෙන ගත්තේ එයාගේ මාමා ජේ.ආර්. ජයවර්ධනගෙන්. ජේ.ආර්., රණසිංහ ප්‍රේමදාස සිටි ඒ ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ ප්‍රධාන ඇමතිවරයෙක්. දැන් ඒ අනුව යමින් ඡන්ද කල්දමන්න සූදානම් වෙන්නේ ආණ්ඩුවට මේ රටේ ජනතාවගෙන් ජනමතයක් නැති නිසයි."

# ආණ්ඩුව බදු පරාසය වැඩි කර ජනතාවගේ ගෙළ සිරකර තිබෙනවා



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික

**සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**

ලෝකයේ කිසිදු රටක නොමැති බදු ක්‍රියාවලියක් ලංකාවේ ඇති බවත් එකම වර්ගයේ බදු ගණනාවකින් බදු පිට බදු පනවන බවත් මේ තත්වය තුළ බදු වංචනිකයන්ට අවස්ථා ගණනාවකදී බදු පැහැර හැරීමේ ඉඩකඩ ලබාදී තිබෙන බවත් පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, අයකර ගත හැකි සහ අයකර ගත යුතු අයගෙන් ලබා නොගෙන බදු පැහැර හැරීමේ ඉඩ ලබාදීමටත් බදු පරාසය වැඩි කර, ජනතාවගේ ගෙළ සිරකිරීමටත් ආණ්ඩුව කටයුතු කර ඇති බවට චෝදනා කළේය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙලෙස කරුණු දැක්වූයේ පසුගිය 13වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ ජාතික ජන බලවේගයේ ආර්ථික කවුන්සිලයේ මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

# දැන් තිබෙන්නේ යටත්වැසියන් වෙනුවට පුරවැසියන් බලගැන්වුණු යුගයක්



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික

**ලක්ෂ්මන් නිපුණආරච්චි සහෝදරයා**

පාලකයින්ට අවශ්‍ය වී ඇත්තේ පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට සිටි යටත්වැසියන් වැනි ජනතාවක් බවත් ජනතාව පුරවැසියන් බවට පත් වෙනවාට පාලකයින් කැමැති නොවන නමුත් මේ වන විට සිටින්නේ ජාතික ජන බලවේගයේ මැදිහත්වීමෙන් පුරවැසියන් බවට පත් කළ ජනතාවක් බවත් මෙය යටත්වැසියන් වෙනුවට පුරවැසියන් බලගන්වුණු තීරණාත්මක යුගයක් බවත් ජාතික ජන බලවේගයේ විධායක සභික ලක්ෂ්මන් නිපුණආරච්චි සහෝදරයා ප්‍රකාශ කළේය.

ලක්ෂ්මන් නිපුණආරච්චි සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 15වැනි දින පිළියන්දල බස්නැවතුම්පළ අසල පැවති ජාතික ජන බලවේගයේ කැස්බෑව ආසන සමුළුව අමතමිනි.


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.